කාර්යය සාධන වාර්තාව - 2024

செயற்திறன் அறிக்கையும் –2024

Performance Report - 2024



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

மாவட்ட செயலகம் - மாத்தறை

District Secretariat – Matara

පටුන

දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය		1
1	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3
1.1	හැඳින්වීම	3
1.2	ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු	4
1.3	ප්‍රධාන කාර්යයන්	5
1.4	සංවිධාන සටහන	6
1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල	7
1.6	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන / අරමුදල්	9
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	9
2	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10-27
3	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය	28
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	28
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	29
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	30
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	31-47
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	48-49
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	49
3.7	මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	50-57
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	58
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	58
4	කාර්යසාධන දර්ශක	59
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	59
5	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	60
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	60-68
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	69
6	මානව සම්පත් පැතිකඩ	70
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	70
6.2	ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද	70
6.3	මානව සම්පත් සංවර්ධනය	70-97
7	අනුකූලතා වාර්තාව	98-104

දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවිඩය .....



දිස්ත්‍රික් පරිපාලනය ශක්තිමත් කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ඉටුකිරීම සඳහා 2024 වර්ෂය තුල රජය මගින් මාතර දිස්ත්‍රික්කය වෙත ලබාදෙන ලද ප්‍රතිපාදන තුලින් ඉටුකල සේවාවන් කැටිකොට 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව එළි දැක්වීමට ලැබීම පිළිබඳව බෙහෙවින් සතුටට පත්වෙමි.

ස්වභාවික හා වෙනත් ආපදා හමුවේ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව සුරක්ෂිත කරමින් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන මඟින් මාතර දිස්ත්‍රික්කය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව යෙදවීමට අදාල නායකත්වය හා සම්බන්ධීකරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ලබාදෙමින් අදාල කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට හැකි වී ඇත.

මුහුණ දීමට සිදුවූ ගංවතුර තත්ත්වය මනාව කළමනාකරණය කරමින් ජනතාව නැවත සවිබල ගැන්වීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය හා අනෙකුත් ආයතන ප්‍රධානීන් සමඟ එක්වී සාර්ථකව සිදුකරන ලදී.

මාතර දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහා සිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, කෘෂිකාර්මික කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දෙමින් තරුණ ප්‍රජාව කෘෂිකාර්මික කටයුතු සඳහා යොමුකිරීම, නව බෝග හඳුන්වා දීම, මිනිස් ක්‍රියාකාරකම් හා දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන පාරිසරික ගැටළු වලට විසඳුම් සෙවීම හා පාරිසරික සංරක්ෂණය ගිං, නිල්වලා ගංහාවන්ගෙන් පෝෂණය වන ප්‍රදේශවල ගංවතුර පාලනය කර සංවර්ධනය කිරීම යන කරුණු වලට ප්‍රමුඛතාවය ලබාදෙමින් ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම කාර්යසාධන වාර්තාව සැකසීම සඳහා සහය ලබාදුන් සැමට මගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර, මාතර දිස්ත්‍රික්කය තුල තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා සැමොම එක්ව කටයුතු කිරීමේ වැදගත්කම ද අවධාරණය කරමි.

ඕ.වී. චන්දන නිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මාතර.
2025.06.

ඕ. වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මාතර

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

වැය ශීර්ෂ අංකය 262

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

නිල්වලා නදී නිම්නයේ සොඳුරු පරිපාලන මධ්‍යස්ථානය ලෙස පවතින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 කින් සමන්විත වන අතර ග්‍රාම නිලධාරී වසම් 650 කට බෙදා වෙන්කර ඇත.

දකුණු ලක මහ සයුරට මායිම්ව පිහිටි අභිමානනීය ඉතිහාසයකට උරුමකම් කියන මාතර දිස්ත්‍රික්කය උදාර අතීත ජනතාවගෙන් සැදුම්ලත් ඓතිහාසික ප්‍රදේශයකි. රෝහණ පුරවරයේ ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව හා රත්නපුර දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටා ඇති වර්ග කිලෝ මීටර් 1282.5 ක් හෙවත් හෙක්ටයාර් 128,250 ක භූමි ප්‍රමාණයක වපසරියකින් යුක්ත ලෝක උරුම සිංහරාජ භූමියේ කොටසක් ඇතුලත්ව සශ්‍රීක භූමි ප්‍රදේශයක් වශයෙන් මාතර දිස්ත්‍රික්කය හඳුන්වා දීම උචිත වේ.

මාතර දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකය මත පදනම් කර්මාන්ත ප්‍රමුඛස්ථානයෙහිලා සැලකිය හැකිය.ඒ අතරින් තේ කර්මාන්තය ප්‍රධාන වේ.

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ජනගහන සංයුතිය පහත පරිදිවේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	භූමි ප්‍රමාණය ව.කි.	ජනගහනය
1. මාතර	53.9	128,370
2. වැලිගම	44.0	78,911
3. කඹුරුපිටිය	60.9	45,549
4. හක්මණ	47.7	36,172
5. පස්ගොඩ	148.3	70,731
6. කොටපොල	175.5	70,151
7. මාලිම්බඩ	44.7	41,248
8. අකුරැස්ස	148.8	59,567
9. දික්වැල්ල	51.9	61,448
10. තිහගොඩ	45.2	37,190
11. මුලටියන	115.3	58,460
12. දෙවිනුවර	39.9	54,246
13. වැලිපිටිය	64.3	59,775
14. කිරින්ද	37.5	22,704
15. පිටබැද්දර	141.6	59,387
16. අතුරලිය	63.0	36,073
එකතුව	**1282.5**	**919,983**

මූලාශ්‍රය- ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

1.2. ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

දැක්ම

"සේවා ලාභීන් තෘප්තිමත් වන පරිදි කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම තුළින් විශිෂ්ටත්වය කරා මාතර දිස්ත්‍රික්කය මෙහෙයවීම."

මෙහෙවර

"රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික හා මූල්‍ය සම්පත් උපායශීලීව හසුරුවමින් ජනතා හිතවාදී පරිපාලන යාන්ත්‍රණයක් බිහි කර දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් ඇති කරලීම."


අරමුණු

1. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යෑම.
2. ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මගින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.
3. ප්‍රතිලාභීමුඛ ආකල්ප, වගකීම්, විවක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
4. රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
5. රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති වලට අනුකූල වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මකවන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.
7. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජමය හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ඔස්සේ ඉටුකර දීම.
8. දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි හා නිශ්චිත තොරතුරු ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක්රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.
9. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රජයේ විවිධ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුන්ට හිමි ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.
10. ගං වතුර, සුළි සුළං, නියඟ, මුහුදු ගොඩ ගැලීම් වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන තත්වය යථා තත්වයට පත් කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

01. දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.
02. දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
03. විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
04. දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 16 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා එහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට ක්‍රියා කිරීම.
05. පරිපාලන කටයුතු වලදී ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.
06. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතන වල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
07. සියලුම මැතිවරණ කටයුතුවලදී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වලදී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.
08. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
09. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම සහ අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
10. මුහුදු ගොඩගැලීම, නියඟ, ගං වතුර, සුළි සුළං වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම තුලින් ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.
11. විදේශාධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මගින් වත්කම් කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම.

1.4. සංවිධාන සටහන


දිස්ත්‍රික් ලේකම්තුමා
අධ්‍යක්ෂ සැලසුම්
අධ්‍යක්ෂ සමෘද්ධි
අති.දි.ලේ. -පාලන
අති.දි.ලේ. -ඉඩම්
දිස්. ඉංජිනේරු
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ සැලසුම්
සහකාර දිස්ත්‍රික් ලේකම්
සහකාර අධ්‍යක්ෂ ආපදා
ගණකාධිකාරී
සංඛ්‍යාලේඛණ
සහකාර අධ්‍යක්ෂ පළාත්
සහකාර අධ්‍යක්ෂ කුඩා ව්‍යාපාර
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරී
ජ්‍යෙෂ්ඨ මෝටර්රථ වාහන පරීක්ෂක
සමෘද්ධි කළමණාකරු
කාර්ය භාර නිලධාරී
සංඛ්‍යාලේඛණ නිලධාරී
දිස්ත්‍රික් සංඛ්‍යාන නිලධාරී
ජ්‍යෙෂ්ඨ විමර්ශණ නිලධාරී
ව්‍යාපාර සංවර්ධන නිලධාරී
ව්‍යෙත්තිය මාර්ගෝපදේශණ නිලධාරී
මානව සම්පත් සම්බන්ධීකාරක
සංවර්ධන සම්බන්ධීකාරක
රෙජිය අමාත්‍යාංශ නිලධාරීන්
ගෞද්ධ කටයුතු සම්බන්ධීකාරක
පරිසර නිලධාරී
මෝටර්රථ වාහන පරීක්ෂක
අංශ ප්‍රධානී
අංශ ප්‍රධානී
අංශ ප්‍රධානී
ප්‍රධාන ලිපිකරු
අංශ ප්‍රධානී
මුදල් සහකාර
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක
රියදුරු
කාර්යාල කාර්ය සහායක

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1. මාතර
2. වැලිගම
3. කඹුරුපිටිය
4. හක්මණ
5. පස්ගොඩ
6. කොටපොල
7. මාලිම්බඩ
8. අකුරැස්ස
9. දික්වැල්ල
10. තිහගොඩ
11. මුලටියන
12. දෙවිනුවර
13. වැලිපිටිය
14. කිරින්ද පුහුල්වැල්ල
15. පිටබැද්දර
16. අතුරලිය

මාතර දිස්ත්‍රික්කයේ පිහිටීම



1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

ලැබී නොමැත.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ලැබී නොමැත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජයග්‍රහණ

2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජයග්‍රහණ

ක්ෂේත්‍රය අංශය මගින් ලබාගත් ජයග්‍රහණ

01. සමාජ ආරක්ෂණ රක්ෂණ ක්‍රමයට බඳවා ගැනීම අතුරින් දකුණු පළාතෙන් ප්‍රථම ස්ථානය ලබා ගැනීම.

1996 අංක 17 දරණ පනතින් රජයේ විශ්‍රාම වැටුපක් නොමැති ස්වයං රැකියා හා අවිධිමත් අංශයේ රැකියාලාභීන්ට විශ්‍රාම වැටුප් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී. ලංකාවේ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර 2024 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයෙන් සාමාජිකයින් 2764 ක් බඳවා ගනිමින් (මුදල. රු. 4,283,593.00) දකුණු පළාතේ ප්‍රථම ස්ථානයට මාතර දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ අංශය පත්විය.

02. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ස්වාභිමානී ජාතික සම්මාන උළෙලේ,

- හොඳම ස්වශක්ති සංවිධානය - කොටපොල ස්වශක්ති සංවිධානය
- හොඳම ස්වශක්ති සාමාජිකයා - දිකවැල්ල ස්වශක්ති සංවිධානයේ යේෂ් මොහොමඩ් මහතා
- ආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කළ සේවක සංඛ්‍යාව 50 ට වැඩි සේවා යෝජකයා - දික්වැල්ල මියාමි ක්ලෝදීන් ආයතනය
- නිවෙස් මට්ටමින් සමාජගත වූ ආබාධ සහිත සාර්ථකම පුද්ගලයා - දයානි බණ්ඩාර මිය (දෙවන ස්ථානය)
- ප්‍රාදේශීය මට්ටමින් කාර්යක්ෂම සමාජ සේවා නිලධාරි - කොටපොල සමාජ සේවා නිලධාරී ඊ. ඒ. අයි. කුමාරි මිය. (දෙවන ස්ථානය)
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකියා ලබාදුන් සේවක සංඛ්‍යාව 50 ට අඩු සේවා යෝජකයා - දික්වැල්ල CND ෆැෂන් (තුන්වන ස්ථානය)

03. ආබාධ සහිත පුද්ගලයින් රැකියා ගත කිරීමේ ESPD වැඩසටහනේ ජාතික මට්ටමේ දෙවන ස්ථානය (රැකියාගත කිරීම්- 35)

04. ආබාධ සහිත පුද්ගලයින් සඳහා මැනිවරණ හැඳුනුම්පත් ලබාදීමේ ජාතික වැඩසටහන වඩාත් සාර්ථකව සිදුකල ලංකාවේ හොඳම දිස්ත්‍රික්කය - මාතර (540)

05. ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින් සඳහා රියදුරු බලපත් ලබාදීම ඉතාමත් සාර්ථකව සිදුකිරීම (36 ක් සඳහා)

06. ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාත්‍යන්තර සැමරුම් දින වැඩසටහන දෙසැම්බර් 03 දින සාර්ථකව සිදු කිරීම.
07. ආබාධ පුද්ගල දිස්ත්‍රික් මළල ක්‍රීඩා උළෙල සාර්ථකව සිදු කිරීම.
08. වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සිදුකරන ලද දිරිය පියස නිවාස වැඩසටහන සාර්ථකව සිදු කල දිස්ත්‍රික්කය බවට පත්වීම.
09. විශ්ව විද්‍යාල සිසුන් ව්‍යාපාර සඳහා සුදානම් කිරීමේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය දියත් කල BRAIN INTO BUSINESS වැඩසටහනේ රු. 250,000 ක ප්‍රදානයන් මාතර සිසුන් 06 දෙනෙකු සඳහා ලබා ගැනීම.
10. විශ්ව විද්‍යාල විද්‍යායතන (UNIVERSITY COLLEGE) සිසුන් ව්‍යාපාර සඳහා සූදානම් කිරීමේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය දියත් කල BRAIN INTO BUSINESS වැඩසටහනින් රු. 250,000 ක ප්‍රදානයන් මාතර සිසුන් 03 දෙනෙකු සඳහා ලබාගැනීම.
11. MADE IN SRI LANKA ලෝගෝව සන්නාමය මාතර දිස්ත්‍රික් ව්‍යවසායකයින් 04 දෙනෙකුට ලබාදීම.
12. දකුණු පළාත් ව්‍යවසායකත්ව සම්මාන උළෙලේ සම්මානලාභීන් 13 දෙනෙකු මාතර දිස්ත්‍රික්කයෙන් බිහි කිරීම. කුසලතා ඇගයීම් 13 ක් ද මාතර දිස්ත්‍රික්කයට හිමි විය.
13. අගනුවරට පමණක් සීමා වී තිබූ යහපත් ජීවන තත්වයක් පාරිභෝගික ජනතාවට ලබාදීමේ අරමුණින් පිහිට වූ GOOD MARKET මාතර දිස්ත්‍රික්කයට ද හඳුන්වා දීම.

2024 වර්ෂයේ කෘෂිකර්ම අංශය ලද ජයග්‍රහණ

1. මාතර දිස්ත්‍රික්කය සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්ම සකස් කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2024 වර්ෂය සඳහා යළ හා මහ කන්න දෙකකට අදාළව වී, අතිරේක ආහාර බෝග, එළවළු හා පළතුරු සඳහා ගොවිජන සංවර්ධන බලප්‍රදේශ මට්ටමෙන් ලබාගන්නා තොරතුරු අනුව සකස් කරන ලද වාර්ෂික කෘෂිකර්ම සැලැස්ම නියමිත දිනට පෙර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබාදීම කලයුතු අතර ඒ අනුව එක් එක් කන්නය තුල පවතින මාසික ප්‍රගතිය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනයට බදුන් කර ඇත.

02. දිස්ත්‍රික් කෘෂිකර්ම කටිමු රැස්වීම් සංවිධානය, පැවැත්වීම හා වාර්තා සැකසීම

2024 වර්ෂය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු මාසික රැස්වීම් 12 ක් පවත්වා ඇත. වාරිමාර්ග සහ අනෙකුත් කෘෂිකාර්මික ගැටළු පිළිබඳව සාකච්ඡා කොට ඒවා සඳහා විසඳුම් ලබාදීමට අදාලවන ආයතනික දායකත්වය සැපයීමට කටයුතු කර ඇත. එහිදී පැන නඟින ගැටළු පිළිබඳව සාකච්ඡා කොට ඒවා සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමට තවත් අතුරු රැස්වීම් රාශියක්ද සංවිධානය කරමින් එම ගැටළු සඳහා විසඳුම් ලබාදීමට දායක වී ඇත. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වලින් පැන නඟින ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමටත්, ජාතික වැඩසටහන්වල මාසික ප්‍රගතිය විමර්ශනය කරමින් එම වාර්ෂික සැලැසුම්වල ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

03. 2024 යල සහ 2024/25 මහ කන්නවල වී වගා කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායකවීම

ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුව, වාරිමාර්ග දෙපාර්මේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්මේන්තුව, කෘෂිකර්ම දෙපාර්මේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ ගොවි සංවිධාන නියෝජිතයින් ඒකරාශීකොට ගෙන ඉහත කන්න සඳහා දිස්ත්‍රික් ලේකම් ගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග ව්‍යාපාර 05 කට අයත් කන්න රැස්වීම් 05 ක් සංවිධානය , සහභාගිවීම, වාර්තා සැකසීම හා එමඟින් ඉදිරිපත් වන ගැටළු සඳහා විසඳුම් ලබාදීමට අදාළ වන කාර්යයන් සිදු කිරීමට හැකිවිය. තවද, දිස්ත්‍රික්කයේ සියළුම කන්න රැස්වීම් වාර්තා ලබාගෙන එක් එක් කන්නය සඳහා වී වගා රක්ෂණ මෙහෙයුම් කාලසටහන සකස් කිරීම සහ වගා හානි සඳහා වන්දි ලබාදීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ප්‍රගතිය සාකච්ඡා කිරීමට කටයුතු කර ඇත.

04. 2024 අයවැය ඇස්තමේන්තු යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

4.1 ආහාර සුරක්ෂිතාවය හා තාක්ෂණ වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතාවය හා තාක්ෂණ වැඩසටහන යටතේ ව්‍යාපෘති 02 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව අකුරැස්ස, අතුරලිය, වැලිගම, තිහගොඩ, කිරින්ද පුහුල්වැල්ල, දෙවිනුවර, දික්වැල්ල, හක්මණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක "පෙට්ටි මිරිස් වගාව ප්‍රචලිත කිරීම තුලින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර බෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 337 ක් සඳහා රුපියල් මිලියන 1.56912 රජයේ දායකත්වය යටතේ ගුණාත්මක පෙට්ටි මිරිස් පැල හා වගාමළු 29858 බැගින් ලබා දී ඇත, එම පෙට්ටි මිරිස් වගාවන් වල අස්වනු ලබා ගනිමින් පවතී. එසේම මුලටියන සහ කඹුරුපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 ක ප්‍රතිලාභීන් 08 ක් සඳහා රුපියල් මිලියන 0.55325 ක රජයේ දායකත්වය යටතේ විජලන යන්ත්‍ර 08 ක් හා ඒවාට අදාල වන අනෙකුත් අමතර උපකරණ ලබා දී ඇත. අතිරික්ත කෘෂි නිෂ්පාදන හා වෙනත් ඖෂධීය ශාඛ කොටස් විජලනය මඟින් සංරක්ෂණය කොට සකසනු ලබන විජලිත නිෂ්පාදන දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළට ද නිකුත් කරමින් පවතී.

4.2 ජනාධිපති ලේකම් කාර්යාලයේ මොහයවීම යටතේ හඳුන්වාදෙන ලද කෘෂිකර්ම නව්‍යකරණ වැඩසටහන කෘෂිකර්ම තාක්ෂණ භාවිතය දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක විය- අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය- නියමු ව්‍යාපෘතිය

I අදියර- අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල රජයේ දායකත්වය රුපියල් මිලියන 7.44798976 ක වියදමින් පූර්ණ ස්වයංක්‍රිය ආරක්ෂිත ගෘහ 03 ක් පිහිටුවීම්, විසිරුම් ජල තාක්ෂණය සහිත තේ වගාවන් 05 ක් ස්ථාපනය, දියර කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා කිරි ගවයන් 02 ක් මිලදී ගැනීමට මුල්‍ය පහසුකම් ලබාදී ඇති අතර එය ලංකා බැංකුව , මහජන බැංකුව, ග්‍රාමීය සංවර්ධන බැංකුව ඔස්සේ පොලී රහිත ණය මුදලක් ලෙස ලබාදීම සිදු කර ඇත. එසේම රු.මි. 0.07152 ක රාජ්‍ය මුල්‍ය දායකත්වයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

II අදියර- ඒ යටතේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් රු.මි. 16.1298 ක රජයේ මුල්‍ය දායකත්වය යටතේ නිල් කටරොළු මල් වගාව සහ විජලන මධ්‍යස්ථානය පිහිටුවීම, ද්‍රෝණ තාක්ෂණය භාවිතා කොට කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම, පොලිතීන් ගෘහ තුල එළවළු වගාව මඟින් තිරසර අස්වැන්නක් ලබාගැනීම යන ව්‍යාපෘති යෝජනා 03 ක් ඉදිරිපත් කල

නමුත් මෙම ව්‍යාපෘති යොජනා සඳහා අනුමැතිය ලැබී නොමැත. පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනුවෙන් රු.මි. 9.811625 රජයේ දායක්වය යටතේ ව්‍යාපෘති යෝජනා 03 ක් ඉදිරිපත් කර ඇති අතර මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනුවෙන් රු.මි.10 ක වටිනාකමෙන් යුතු ව්‍යාපාති යෝජනා 05 ක් ඉදිරිපත් කර තිබු අතර ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලැබී නොමැත.

4.2. තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස සහ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. රජයේ දායකත්වය රුපියල් මිලියන 5.9289747 ක වියදමින් අකුරැස්ස මිණිපෝගොඩ ගම්මානයේ ප්‍රතිලාභීන් 134 ක් සඳහා ආහාර බෝග නිෂ්පාදන දිරිගැන්වීම, කෘෂි අපනයන නිෂ්පාදන ඉහල නැංවීම, අගය එකතු කල කෘෂි නිෂ්පාදන දිරිගැන්වීම සහ සත්ත්ව පාලනය ප්‍රවලිත කිරීම වශයෙන් ව්‍යාපෘති 04 ක් සාර්ථකව ක්‍රියාත්මක විය. තවද, රජයේ දායකත්වය රුපියල් මිලියන 6.588001 ක වියදමින් කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුගලහේන ගම්මානයේ ප්‍රතිලාභීන් 44 ක් සඳහා සත්ත්ව පාලනය ප්‍රවලිත කිරීම, ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සහ අපනයන නිෂ්පාදන සහ අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම වශයෙන් ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක විය.

05. 2024 වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම

කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි රාජකාරියේ නියුතු කෘෂිකර්ම, පශුසම්පත්, ග්‍රාමීය ආර්ථික යන අංශ වල සංවර්ධන නිලධාරීන් 77 ක් සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 0.07819 ක වියදමින් ‘‘පුර්ණ ස්වයංක්‍රීය තාක්ෂණය යටතේ ආරක්ෂිත ගෘහ තුල බෝග වගාව’’ පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වා ඇත.

2024 වර්ෂයේ ක්‍රීඩා අංශය ලද ජයග්‍රහණ

මලල ක්‍රීඩා

ක්‍රීඩකයා/ ක්‍රීඩිකාවගේ නම	තරඟ ඉසව්ව	ක්‍රීඩා උළෙලේ නම	ලබා ගත් ස්ථානය
දෙනෙත් ඉදුවර	මීටර් 100*4	ආසියානු කණිෂ්ඨ ශූරතාවලිය	දෙවන ස්ථානය
	මීටර් 100	දකුණු ආසියානු කණිෂ්ඨ ශූරතාවලිය	දෙවන ස්ථානය
	100*4 සහය දිවීම		ප්‍රථම ස්ථානය
		ලෝක කණිෂ්ඨ මලල ක්‍රීඩා උළෙල	නියෝජනය
		ආසියානු සහය දිවීමේ ශූරතාවලිය	නියෝජනය

වීරරත්න	මීටර් 100	ජාතික මහා ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
	මීටර් 100*4	ජාතික මහා ක්‍රීඩා උළෙල	ප්‍රථම ස්ථානය
	මීටර් 100	ජාතික ශූරතාවලිය	තෙවන ස්ථානය
	මීටර් 100	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	ප්‍රථම ස්ථානය
	මීටර් 200	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
	මීටර් 100	ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
එම්.ජී. සදිල රශ්මික	මීටර් 110 කඩුළු	ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
	මීටර් 100*4	සමස්ථ ලංකා සහය දිවිමේ ශූරතාවය	ප්‍රථම ස්ථානය
	මීටර් 200*4	සමස්ථ ලංකා සහය දිවිමේ ශූරතාවය	දෙවන ස්ථානය
	මීටර් 400*4	සමස්ථ ලංකා සහය දිවිමේ ශූරතාවය	දෙවන ස්ථානය
	මීටර් 100*4	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
	මීටර් 400*4	ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා	තෙවන ස්ථානය
අවින්ත පී චන්ද්‍රසිරි	උස පැනීම	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
	දුර පැනීම	ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල	ප්‍රථම ස්ථානය

රුසිත් නිම්සර	දුර පැනීම	ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
	දුර පැනීම	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
එන්. ඒ. කාවින්දි අමාෂා	මීටර් 100 කඩුළු	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
	මීටර් 100 කඩුළු	ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
ස්නේහා බ්‍රයිට් මේරි	මීටර් 400*4	සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
	මීටර් 400*4	ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය
	මීටර් 400*4	සමස්ථ ලංකා සහය දිවීම	තෙවන ස්ථානය
	මීටර් 800*4	සමස්ථ ලංකා සහය දිවීම	තෙවන ස්ථානය
	මෙඩ්ල් රිලේ	සමස්ථ ලංකා සහය දිවීම	දෙවන ස්ථානය
	විස්ටන් මෙඩ්ල් රිලේ	සමස්ථ ලංකා සහය දිවීම	තෙවන ස්ථානය
කේ.පී.ටී.එන්. නිර්මාණි	උස පැනීම	ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල	දෙවන ස්ථානය
සසිඳු හංසක	දුර පැනීම	ජෝන් ටාබට් කණිෂ්ඨ මලල ක්‍රීඩා උළෙල	තෙවන ස්ථානය

පැසි පන්දු

අනු අංකය	ක්‍රීඩකයා/ ක්‍රීඩිකාව/කණ්ඩායමේ නම	ලබා ගත් ස්ථානය
01	පී.ඩබ්.ඕ. උත්තමා ජයතිස්ස	ශ්‍රී ලංකා පාසල් ජාතික කණ්ඩායම නියෝජනය

02	එච්.සී.කේ. කොඩිතුවක්කු	ශ්‍රී ලංකා පාසල් ජාතික සංචිතය නියෝජනය
03	රෂ්මිකා සිතුමිණී කොඩිකාර	ශ්‍රී ලංකා පාසල් ජාතික සංචිතය නියෝජනය
04	මාතර දිස්ත්‍රික් යොවුන් කාන්තා කණ්ඩායම	තරුණ සේවා පැසිපන්දු ජාතික තරගාවලියේ අවසන් මහා තරඟාවලිය සඳහා සුදුසුකම් ලැබීම.
05	මාතර දිස්ත්‍රික් කාන්තා පැසිපන්දු කණ්ඩායම	2024 ජාතික මහා ක්‍රීඩා උළෙලේ දකුණු පළාත් දෙවන ස්ථානය හිමි කර ගැනීම.
06	මාතර දිස්ත්‍රික් පිරිමි පැසිපන්දු කණ්ඩායම	2024 ජාතික මහා ක්‍රීඩා උළෙලේ දකුණු පළාත් දෙවන ස්ථානය හිමි කර ගැනීම.

<u>2024 වර්ෂයේ දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මාතර දිස්ත්‍රික් ක්‍රීඩා අංශය විසින් ලබා ගත් ජයග්‍රහණ</u>

ජාතික මහා ක්‍රීඩා උළේලේ III වන අදියර තරඟ හෙවත් දකුණු පළාත් ක්‍රීඩා උළෙලේ මාතර දිස්ත්‍රික්කය ලබාගත් ස්ථාන

01. දකුණු පළාත් ක්‍රීඩා උළෙලේ සමස්ථ අනුශූරතාවය ලබා ගැනිම

02. මළළ ක්‍රීඩා තරඟ

ලබාගත් රන් පදක්කම් ගණන	**ලබාගත් රිදී පදක්කම් ගණන**	**ලබාගත් ලෝකඩ පදක්කම් ගණන**	**වෙනත්**
10	10	10	- මළලක්‍රීඩා දෙවන පෙළ දක්ෂතම ක්‍රීඩකයා - මළලක්‍රීඩා දෙවන පෙළ දක්ෂතම ක්‍රීඩිකාව

03. කණ්ඩායම් තරඟ

ශූරතාවය	**අනුශූරතාවය**
නෙට්බොල්	පැසිපන්දු (කාන්තා)

කඹ ඇදීම (කාන්තා)	පැසිපන්දු (පිරිමි)
වූෂු (පිරිමි)	ක්‍රිකට් දෘඩ පන්දු (කාන්තා)
වූෂු (කාන්තා)	හොකී (පිරිමි)
කායවර්ධන තරඟ	වොලිබෝල්(පිරිමි)
බොක්ෂිං (පිරිමි)	වෙරළ වොලිබෝල්(පිරිමි)
බොක්ෂිං (කාන්තා)	වෙරළ කබඩි (පිරිමි)
තයිකොන්ඩෝ (කාන්තා)	කඹ ඇදීම (පිරිමි)
	ක්‍රිකට් දෘඩ පන්දු (පිරිමි)
	පාපන්දු (පිරිමි)
	බැට්මින්ටන් (පිරිමි)
	බැට්මින්ටන් (කාන්තා)
	පිහිනුම් තරඟ (පිරිමි) සමස්ථ
	පිහිනුම් තරඟ (කාන්තා) සමස්ථ
	ජිම්නාස්ටික් (පිරිමි)
	ජිම්නාස්ටික් (කාන්තා)
	කැරම් (පිරිමි)
	කැරම් (කාන්තා)
	මල්ලවපොර (පිරිමි)
	මල්ලවපොර (කාන්තා)
	තයිකොන්ඩෝ (පිරිමි)
	කරාතේදෝ (පිරිමි)
	කරාතේදෝ (කාන්තා)
	ජුඩෝ (කාන්තා)
	කණ්ඩායම් තරඟ පිරිමි (සමස්ථ)
	විවිධ ශ්‍රේණි සමස්ථ (කාන්තා)
	විවිධ ශ්‍රේණි සමස්ථ (පිරිමි)
	බරපන්ති තරඟ සමස්ථ (කාන්තා)
	බරපන්ති තරඟ සමස්ථ (පිරිමි)

2024 වර්ෂයේ දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මාතර දිස්ත්‍රික් ක්‍රීඩා අංශය විසින් ලබා ගත් ජයග්‍රහණ

48 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේදී මාතර දිස්ත්‍රික්කය ලබා ගත් ජයග්‍රහණ

අනු අංකය	නම	ඉසව්ව	ජයග්‍රහණය
01	බී.චතුරිකා ප්‍රියන්ති	බර ඉසිලිම (87 Kg)	රන් පදක්කම (ශ්‍රී ලංකා වාර්තාව/නව තරහ
02	එස්.එස්. ප්‍රියලංකා	හොකී	දක්ෂතම ක්‍රීඩකයා
03	ඩබ්.ඩබ්.කේෂර නුවන්ත	දෘඩ පන්දු ක්‍රිකට්	දක්ෂතම ක්‍රීඩකයා
04	ඩී.දිලිනි කාංචනා	රග්බි	දක්ෂතම ක්‍රීඩිකාව
05	ටී.එන්. කොඩිතුවක්කු	මීටර් 400*4	රන් පදක්කම
06	එල්.අයි.එන්. මල්ෂානි	බොක්ෂිං (50-52 kg බර පන්තිය)	රන් පදක්කම
07	ඩබ්.ඩබ්.ඒ.කේ. තිවංකා	බොක්ෂිං 66-70 kg බර පන්තිය)	රන් පදක්කම
08	කවිත්මා හසරැලි සිරිමෙවන්	වෙස්	රන් පදක්කම
09	බී.එස්.එම්.ටී. කුරේ	වෙස්	රන් පදක්කම
10	කේ.ඒ.සී. දුලංජලී	කුමිතේ 68 kg	රන් පදක්කම
11	එච්.ජී.එස්. කුමාර	කායවර්ධන (70 kg බර පන්තිය)	රන් පදක්කම
12	ඩබ්.එම්.ඩී. තරුෂ් දම්දු සංකල්ප	ක්‍රිකට්	රන් පදක්කම
13	කේ.වී. නිෂන් දෙවිමිත්	ක්‍රිකට්	රන් පදක්කම
14	එම්.ඒ විදාන පතිරණ	ක්‍රිකට්	රන් පදක්කම
15	ඩබ්.ඩබ්.ආර්.නිමන්ත	ක්‍රිකට්	රන් පදක්කම
16	කේ.ජී. දිල්කි ප්‍රසංජලී සත්සරණී	රගර්	රන් පදක්කම

17	එච්.කේ.එන්. සඳරුවනි	රගර්	රන් පදක්කම
18	පී.ඒ. ගුණරත්න	හොකී	රන් පදක්කම
19	එස්.පී. සුදුසිංහ	හොකී	රන් පදක්කම
20	අයි.එම්. බඩ්.කුලතුංග	හොකී	රන් පදක්කම
21	පී.ඒ.ජී. ශ්‍රීමාල් කිත්සිරි	හොකී	රන් පදක්කම
22	එච්.ජී. සඳනි දෙවිමිණී	බැට්මින්ටන් (කාන්තා) කණ්ඩාම්	රිදී පදක්කම
23	ටී.කේ.එච්. ලක්මාල්	කරාතේ දෝ (පිරිමි)කුමිතේ 55 kg	රිදී පදක්කම
24	ජී.එම්. මංජුල මධුශාන් ධර්මදාස	කායවර්ධන (80 kg බර පන්තිය)	රිදී පදක්කම
25	සොනාලි හංසිකා ජයසේකර	බොක්ෂිං (70 - 75 kg බර පන්තිය)	රිදී පදක්කම
26	පී.කේ.කේ. ශ්‍රීනාත්	බොක්ෂිං (75 - 80 kg බර පන්තිය)	රිදී පදක්කම
27	ඒ.ඩබ්. හෙට්ටිගේ	බොක්ෂිං (86-92 kg බර පන්තිය)	රිදී පදක්කම
28	ජේ.එම්.කේ. අයනිජ	වූෂූ	රිදී පදක්කම
29	ඒ.වී. සී. නිලුමින්ද	වූෂූ	රිදී පදක්කම
30	එන්. එච්.එම්. සිතුම් නෙත්මිණ	වූෂූ	රිදී පදක්කම
31	එස්.ඊ.ඩී සිල්වා	වූෂූ	රිදී පදක්කම
32	ඩබ්.කේ.බී.කෞෂල්‍යා කාවින්දි	වූෂූ	රිදී පදක්කම
33	ඒ. ආර්. ෆහාම්	පිහිණුම් 60m Back Stroke	රිදී පදක්කම
		4*50m Freestyle Relay	ලෝකඩ පදක්කම
		4*50m Medley Relay	ලෝකඩ පදක්කම

34	එස්.ඩී. ගුරුගේ	4*50m Medley Relay	රිදී පදක්කම
3 5	එල්.ඩබ්.යූ. ප්‍රියංකර	කඹ ඇදීම	රිදී පදක්කම
36	බී.කේ.එම්. හර්ෂණ		
37	ඒ.එම්.එස්. ද සිල්වා		
48	ඒ.ඒ.එස්.ටී. කුමාර		
39	එල්.ටී.ඩබ්. නිසරණී	මලල ක්‍රීඩා - මිටිය විසි කිරීම	ලෝකඩ පදක්කම
40	ඩී.පී.එන්. සමාධි	මලල ක්‍රීඩා - උස පැනීම	ලෝකඩ පදක්කම
41	ඒ.ඩබ්. තාරුක නවෝන් ධනංජය	මලල ක්‍රීඩා - හෙල්ල විසි කිරීම	ලෝකඩ පදක්කම
42	ඒ.ඩබ්.ඒ. කවීෂ අංජන	මලල ක්‍රීඩා - 400*4 මිශ්‍ර සහාය	ලෝකඩ පදක්කම
43	එන්.එල්. ලක්ෂි නවෝදා	මල්ලව පොර 76 kg බර පන්තිය	ලෝකඩ පදක්කම
44	එච්. ශානුක දිල්ශාන්	කරාතේ දෝ කේවල කාතා	ලෝකඩ පදක්කම
45	එස්.එම්. පී.ඒ. සුහාෂ්	කාය වර්ධන 65 kg බර පන්තිය	ලෝකඩ පදක්කම
46	කේ.එම්. තරිඳු සුහාෂ්	බොක්ෂිං 80 - 86 kg බර පන්තිය	ලෝකඩ පදක්කම
47	ජේ.එම්. සදීරා කලණි	නෙට්බෝල්	ලෝකඩ පදක්කම
48	වී.පී. සංජීවනී		
49	බී.එච්.එම්.එස්. රදිනා සංජීව		
50	අයි.ඩී. ගොඩගේ		
51	එම්.ජී. රෙහෙනි දහරා		
52	ඒ.කේ. නෙතලි ප්‍රභාෂ්වරී ආරියනාත		

53	ජුවානා බදුගේ නිත්මි රුවින්ද්‍යා		
54	එල්.පී.එස්.එස්. ඩයස්		

2024 වර්ෂයේ ක්‍රමසම්පාදන අංශය ලබාගත් ජයග්‍රහණ

වැඩසටහන	ප්‍රතිපාදන ලැබුණු අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ලැබුණු ප්‍රතිපාදන රු. මි.	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම රු.මි (පරිපාලන වියදම සමඟ)
ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	ප්‍රවාහන මහාමාර්ග වරාය,ගුවන්සේවා අමාත්‍යාංශය	77.01	64	60	59.29
ගෘහ ආශ්‍රිත එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය	කෘෂිකර්ම,පශුසම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය	4.90	1	1	4.3
වැලිගම - මිරිස්ස සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය	7.30	4	4	6.5
සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන	කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය	6.20	1	1	5.79
ඌන සංවර්ධිත දහම් පාසල්	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	1.70	25	24	1.6
ආපදාවට ලක් වූ විහාරස්ථාන	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	1.39	4	4	1.38
ග්‍රාමීය විහාරස්ථාන සංවර්ධනය කිරීම	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	3.00	2	2	2.99
බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වෙනත් ව්‍යාපෘති	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	5.50	1	1	5.49
පිරිවෙන් සංවර්ධනය	අධ්‍යාපන අමාත්‍යාංශය	13.97	11	9	12.08
වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්ධන	වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය	12.38	0	ගෙවීම් කල ගස් ගණන	12.336

වැඩසටහන				4078	
වතු ආශ්‍රිත පාසල් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය	අධිකරණ අමාත්‍යාංශයේ ජාතික සමගිය හා ප්‍රතිසංවිධාන කාර්යාලය	1.88	1	1	1.874
වතු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	පරිසර වනජීවී ජලසම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය	8.70	2	1	0..69
එකතුව		**143.92**	**116**	**108**	**113.63**

අනෙකුත් ව්‍යාපෘති

1. පළාත් මට්ටමින් දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම.
2. සරුසාර මාතොට II අදියර යටතේ ආන්තික පවුල් දිරිගැන්වීමේ වැඩසටහන සිදු කිරීම.
3. ආහාර සුරක්ෂිතතා වැඩසටහන සිදු කිරීම.

2024 වර්ෂයේ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය (මාතර කාර්යාලය) ලද ජයග්‍රහණ

1. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ආවරණය පරිදි වැටලීම් 1011 ක් සිදු කිරීම. (දඩ මුදල - රු. 6,875,500)
2. මාතර දිස්ත්‍රික්කයේ පාසල් සිසුන්, පාරිභෝගිකයින්, වෙළඳුන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් 21 ක් සිදු කිරීම.
3. පාරිභෝගික සහන පැමිණිලි 59 ක් විමර්ශනය කර පැමිණිලි 52 කට පාරිභෝගිකයින් හට සහන ලබා දී ඇත.
4. 2024 වර්ෂයේ සියලුම මාසයන් වල මිල සමීක්ෂණය සිදු කිරීම.

2024 වර්ෂයේ සංඛ්‍යාලේඛන අංශය ලද ජයග්‍රහණ

01. 2024 ජන හා නිවාස සංගණනය සැලසුම් කළ දින වකවානු තුල සාර්ථකව දිවයිනේ මුලින්ම අවසන් කල දිස්ත්‍රික්කය බවට පත්වීම.
02. රාජ්‍ය සේවා සංගණනය 2024 මැයි මස 28 දිනට අවසන් කිරීම.
03. පළාත් පාලන ආයතන 17 මගින් වාර්ෂික සංඛ්‍යාලේඛන 204ක් මගින් තොරතුරු එක්රැස් කොට අවසන් කර තිබීම.

04. 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මගින් සංඛ්‍යාලේඛන කාර්තුමය වශයෙන් ලබාගෙන අවසන් කිරීම.
05. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණ සඳහා තිබූ කර්මාන්ත 111 න් 89 ක තොරතුරු කඩිනමින් ලබා ගැනීම.

2024 වර්ෂයේ ඉංජිනේරු අංශය ලද ජයග්‍රහණ

01. දිස්ත්‍රික් මිල කමිටුව රැස්වී අදාළ වාර්තා ලබා දීම.
02. පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේ තෙවන අදියරේ වැඩ ආරම්භ කිරීම.
03. මුලටියන පියදාස රත්නායක සිල්මාතා ආරාමය දෙවන අදියර ඉදි කිරීම.
04. කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම.
05. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ ඉදිකිරීම්, ඇස්තමේන්තු පරීක්ෂාව හා අධීක්ෂණයන් ඉටුකිරීම.
06. දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැඟිලි, සංචාරක බංගලා, නිල නිවාස අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
07. පීක්වැල්ල සංචාරක බංගලාව අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
08. කැකණදුර ගොවිපොළ පාර සංවර්ධනය, එළගාල සකස් කිරීම, කිරිහල නවීකරණය, මස් සැකසුම් ඒකකය අළුත්වැඩියාව.

ඉදිරි ඉලක්ක

2025 වර්ෂයේදී කෘෂිකර්ම අංශය මගින්,

දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති යෝජනා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

අනු අංකය	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී දායකත්වය (රු. මි)	රජයේ දායකත්වය (රු. මි)	මුළු පිරිවැය (රු. මි)
01	වාණිජ බිම්මල් වගාවට ග්‍රාමීය ප්‍රජාව දිරිගැන්වීම තුලින් දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම	14.4020575	9.33914648	23.74120398
02	ඇම්බන් කෙසෙල් වගාව ප්‍රවර්ධනය තුලින් මාතර දිස්ත්‍රික්කයේ පළතුරු නිෂ්පාදනය ඉහල නැංවීම	1.14424	0.86211	2.00635
03	වැල්දොඩම් වගාව ප්‍රචලිත කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ පලතුරු	1.206864	1.143609	2.350473

	නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම			
04	බිම්මල් වගාව සඳහා යාන්ත්‍රීකරණය හඳුන්වා දීම තුළින් නිෂ්පාදන ධාරිතාවය සහ ව්‍යවසායකත්වය ඉහළ නැංවීම - 2025	0.489	0.491928	0.980928
05	වාණිජ මට්ටමින් අන්නාසි වගාව ව්‍යාප්ත කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම.	2.49678	2.20896375	4.70574375
06	වන සත්ව හානිය පාලනය මඟින් දිස්ත්‍රික්කයේ බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම	0.7175	0.69628	1.41378
07	හම්බන් පුවක් වගාව ප්‍රචලිත කිරීම ඉහල නැංවීම මඟින් නව ව්‍යවසායකයින් බිහිකිරීම	1.8	0.572268	2.372268
08	ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව ප්‍රචලිත කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය ඉහල නැංවීම	10.75716	9.284523	20.041683
09	පෙට්ටි මිරිස් වගාව ප්‍රචලිත කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාවය ඉහල නැංවීම	2.4225	1.23285850	3.6553585

2025 වර්ෂයේදී ක්‍රීඩා අංශය මඟින්,

1. මාතර දිස්ත්‍රික්කයේ සියලුම ක්‍රීඩා සමාජ සවිබල ගැන්වීම සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම හා මාතර දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාම නිලධාරී වසමකම ක්‍රීඩා සමාජ පිහිටුවීම හා දැනට තිබෙන සියලු ක්‍රීඩා සමාජ ප්‍රතිසංවිධානය කිරීම.

2. ජාතික මහා ක්‍රීඩා උළෙලට සුදුස්සන් තෝරා ගැනීමට i අදියර තරඟ හෙවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අන්තර් ක්‍රීඩා සමාජ තරඟ වැඩි සහභාගිත්වයකින් පැවැත්වීම.

3. ජාතික මහා ක්‍රීඩා උළෙලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා පවත්වන ii අදියර තරඟ හෙවත් මාතර දිස්ත්‍රික් තරඟ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ජයග්‍රාහකයන් වැඩි සහභාගිත්වයක් ඇතිව ඉතා ඉහළින් පැවැත්වීම.

4. දකුණු පළාත් තරඟ සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් ඉතා දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් පුහුණුකර නවීන තාක්ෂණ දැනුම ලබා දී තරඟ සඳහා ඉදිරිපත් කර දැනට සිටින දෙවන ස්ථානයෙන් දකුණු පළාතේ ප්‍රථම ස්ථානය ලබා ගැනීම.

5. ජාතික මහා ක්‍රීඩා උළෙල හා අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කිරීම හා ජයග්‍රහන ලබා ගැනීම.

6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පිහිටි ක්‍රීඩා නිලධාරීන්ගේ පුහුණු මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් පුහුණුකරුවන්ගේ පුහුණු මධ්‍යස්ථාන සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම හා ක්‍රීඩාංගණ හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඉහළ නැංවීම.

7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් විශේෂ ක්‍රීඩා අනුව පුහුණු කඳවුරු පවත්වා ක්‍රීඩා දක්ෂතා වැඩි දියුණු කිරීම මඟින් ඉතා ඉහළ ජයග්‍රහණ ලබා ගැනීම.

8. නවීන තාක්ෂණය ගමට ගලා යාම සඳහා ප්‍රාදේශීය මට්ටමින් ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම හා මාතර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා විනිසුරුවන් වෙනුවෙන් නවීන තාක්ෂණික දැනුම හා ජාත්‍යන්තර මට්ටමින් වෙනස් වූ නව නීති රීති හඳුන්වාදීම සඳහා වැඩමුළු, දේශන හා පාඨමාලා පැවැත්වීම.

9. ජාතික ක්‍රීඩා දිනය සැමරීම සඳහා වැඩසටහන් කිරීම හා මාතර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා තරඟාවලි පවත්වා ශූරතා කුසලාන හා සහතික ලබා දීම.

10. ජාතික තරඟ සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පෝෂණ ද්‍රව්‍ය හා ක්‍රීඩා උපකරණ හා ඇඳුම් පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ලබා දීම.

11. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රජාව සඳහා බෝනොවන රෝග වැලැක්වීම සඳහා ශරීර සුවතා හා යෝග වැඩසටහනක් පැවැත්වීම මඟින් මානසික හා ශාරීරික වශයෙන් නීරෝගිමත් ප්‍රජාවක් මාතර දිස්ත්‍රික්කයට හා රටට දායාද කිරීම.

12. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහනය කරන ලද මාතර දිස්ත්‍රික් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දකුණු පළාත් වර්ණ ප්‍රධානෝත්සවයේදී වැඩිම මූල්‍ය ත්‍යාග හා වර්ණ ලබා ගැනීමට යොමු කිරීම.

13. මෙම වසරේදීත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වෙන තරගාවලීන් සඳහා උපරිම සහය දැක්වීම.

14. ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකරවීම හා ජාතික හා ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගැනීමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කර වීම.

15. දෙනියාය, අකුරැස්ස කලාපයන්හි මලල ක්‍රීඩා පුහුණු කඳවුරු පැවැත්වීම.

16. මාතර දිස්ත්‍රික් මලල ක්‍රීඩා ශූරතාවලිය පැවැත්වීම.

17. 2025 පෙබරවාරි මාසය වන විට ළමා මලල ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන පැවැත්වීම.

18. මාතර දිස්ත්‍රික් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ හිමි කර ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම සඳහා අවුරුදු 4කට වරක් පැවැත්වෙන වර්ණ ප්‍රධානෝත්සවය පැවැත්වීම.

19. දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීම.

20. දැනටමත් ආසියානු කණිෂ්ඨ තරඟාවලි ජයග්‍රණ ලබා ගත් දෙනෙත් ඉදුවර ක්‍රීඩකයා ආසියානු විවෘත තරඟාවලි ජයග්‍රහණය කිරීම සඳහා විශේෂ අවධානයකින් යුක්තව පුහුණු කරවීම.

21. කොටවිල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා භෞතික සම්පත් හා යටිතල පහසුකම් දියුණුකරමින් ක්‍රීඩක දක්ෂතා දියුණුකර ගැනීම සඳහා කටයුතු කිරීම.

2025 වර්ෂයේදී ක්‍රම සම්පාදන අංශය මගින්,

1. 2025 වර්ෂයට අදාලව විමධ්‍යගත අයවැය වැඩසටහන සිදු කිරීම.
2. RIDP ග්‍රාමීය මාර්ග වැඩසටහන සිදු කිරීම.
3. Clean Sri Lanka වැඩසටහන යටතේ යෝජිත කාර්යයන් ඉටු කිරීම.
4. දිස්ත්‍රික් සම්පත් පැතිකඩ යාවත්කාලින කිරීම.
5. අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම.

2025 වර්ෂයේදී සංඛ්‍යාලේඛන අංශය මගින්,

1. 2025 වර්ෂයට අදාලව නිශ්පාදන මිල රැස් කිරීම.
2. 2025 වර්ෂයට අදාලව ශ්‍රම බල සමීක්ෂණය සිදු කර අවසන් කිරීම.
3. 2025 වර්ෂයට අදාලව ගොඩනැගිලි හා සත්ත්ව සංඛ්‍යාලේඛන සැකසීම.
4. 2025 වර්ෂයට අදාලව වාර්ෂික පොල් සමීක්ෂණය සිදු කිරීම.

5. 2025 වර්ෂයේ යල කන්නයට හා මහ කන්නයට අදාලව ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන සැකසීම.
6. 2025 වර්ෂයේ යල කන්නයට හා මහ කන්නයට අදාලව වී අස්වනු සමීක්ෂණය සිදු කිරීම.
7. පළාත් පාලන සංඛ්‍යා ලේඛන 2025 මැයි 31 දිනට පෙර අවසන් කිරීම.
8. 2025 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයට අදාලව ගෘහ ඒකක ආදායම් වියදම් පිළිබඳ සමීක්ෂණය සිදු කිරීම.
9. ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය ප්‍රධාන කාර්යාලයෙන් ලබා දෙන දිනට අවසන් කිරීම.
10. ආර්ථික සංගණනය 2025 අගෝස්තු මස ආරම්භ කර ඔක්තෝම්බර් මස අවසන් කිරීම.


2025 වර්ෂයේදී ඉංජිනේරු අංශය මගින්,

1. පෝරතොට සමෘද්ධ බැංකුවට කොටසක් එකතු කිරීම. (ඇස්තමේන්තු ගත මුදල රු.6,184,939.16)
2. යටියන සමෘද්ධි බැංකුව ඉදිකිරීම (ඇස්තමේන්තු ගත මුදල රු.15,561,984.44)
3. වැලිපිටිය බොරාල සමෘද්ධි බැංකුව ඉතිරි වැඩ නිමකිරීම. (ඇස්තමේන්තු ගත මුදල රු.10,943,892.56)
4. තුඩාව සමෘද්ධි බැංකුවේ ආරක්ෂිත තාප්පය හා ගේට්ටුව ඉදි කිරීම. (ඇස්තමේන්තු ගත මුදල රු.3,969,961.85)
5. කිරින්ඳ සමෘද්ධි බැංකුව ආරක්ෂිත වැට හා ගේට්ටුව සකස් කිරීම. (ඇස්තමේන්තු ගත මුදල රු.403,576.12)
6. කිරින්ද සමෘද්ධි බැංකුවේ යතුරු පැදි අංගනය ඉදිකිරීම. (ඇස්තමේන්තු ගත මුදල රු.263,340.72)
7. පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස් මහල් ගොඩනැඟිල්ල 3 වන අදියර ආරම්භ කිරීම.

ඕ. වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මාතර

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



එසිඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	කණ්ඩායම 2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ආනයනික වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්			-	
-	භාණ්ඩාගාර අයිමි		6,774,582,000	4,908,429,485	එසිඒ-3
-	තැන්පතු		1,377,177,088	338,092,730	එසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		131,913,480	93,788,308	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		8,283,672,568	5,340,310,523	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		8,283,672,568	5,340,310,523	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		118,000,000	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		8,165,672,568	5,340,310,523	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
2,189,590,000	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	2,105,116,455	1,297,836,903	
273,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	221,885,332	186,140,021	එසිඒ-2(ii)
497,828,530	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	490,942,637	73,130,607	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
2,961,318,530	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		2,817,944,424	1,557,107,532	
	මූලධන වියදම්				
67,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	59,904,708	41,522,992	
133,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	78,482,444	9,914,802	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
5,800,000	හැකියා වර්ධනය	14	1,619,851	349,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
205,800,000	මුළු මූලධන වියදම් (උ)		140,007,004	51,786,794	
	කැන්පතු ගෙවීම්		1,252,954,249	432,986,291	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		229,358,212	79,678,658	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,482,312,461	512,664,949	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		4,440,263,889	2,121,559,275	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		3,725,408,679	3,218,751,248	
	අඩිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		3,725,408,679	3,218,751,248	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අඩිම ශේෂය		-	-	එසිඒ-3

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒසිඒ-6	3,023,150,066	2,879,518,754
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	344,918,881	247,474,148
මූදල් හා මූදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**3,368,068,947**	**3,126,992,902**
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		21,416,444	48,194,551
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,023,150,066	2,879,518,754
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	323,502,437	199,279,597
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**3,368,068,947**	**3,126,992,902**


පිටු අංක 01 සිට71 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 72 සිට 123 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මූදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : එස්. ආලෝකබණ්ඩාර	නම : ඕ.වී.වන්දන තිලකරත්න	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර : ලේකම්,	තනතුර : දිස්ත්‍රික් ලේකම්/	නම :ටී. ජී. එම්. සුධර්ම
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ	දිසාපති - මාතර	
පළාත් පාලන අමාත්‍යාංශය		
දිනය : 2025.02	දිනය : 2025.02.18	දිනය : 2025.02.19
එස්. ආලෝකබණ්ඩාර ලේකම් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	ඕ. වී. වන්දන තිලකරත්න දිස්ත්‍රික් ලේකම්/දිසාපති මාතර	T. G. M. Sudharama Chief Accountant District Secretariat Office Matara.

2

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	194,254,418	262,749,679
අග්‍රිම ලැබීම්	6,774,582,000	4,908,429,485
අන්තිකාරම් අයකර ගැනීම්	137,626,303	131,460,763
තැන්පතු ලැබීම්	1,377,177,088	338,092,730
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	8,483,639,809	5,640,732,658
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,311,908,577	1,475,688,090
සහනාධාර සහ මාරුකිරීම්	490,942,637	73,130,607
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	4,037,313,610	3,487,681,423
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	118,000,000	-
අන්තිකාරම් ගෙවීම්	132,513,732	119,459,453
තැන්පතු ගෙවීම්	1,252,954,249	432,986,291
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	8,343,632,805	5,588,945,864
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	140,007,004	51,786,794
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	140,007,004	51,786,794
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	140,007,004	51,786,794
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(140,007,004)	(51,786,794)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

වසර අවසන් වන විට ලැබිය යුතු මුදල්

වසර අවසන් වන විට ගෙවිය යුතු මුදල්

වසර අවසන් වන විට ගෙවිය යුතු මුදල්

විෂය විෂයය	අංක	මුදල්										
		මුදල් වෙන් කිරීම්	වෙන්කිරීම් අනුව ලැබීම්	අවසර ලබා ඇති අතිරේක ලැබීම්	සී.ඒ.ජී. 66/69 මත සිදු කිරීම්	මුළු ඇස්තමේන්තු ලැබීම්	මුදල් අවසරය අනුව ලැබීම්	සී.ඒ.ජී. 208 යටතේ අතිරේකව අවශ්‍යතා සම්පාදනය කරන ලද මුදල් (කොන්දේසි සහිත මුදල්)	සැබෑ ලැබීම්	අවසාන ලැබීම් (ඍණාත්මක අගයන් සහිත)	ලැබීම් / (අඩුවීම්) ඇස්තමේන්තු මුදල් % ලෙස	මතභේදවලට තුඩු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)=(5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4) *100	
ප්‍රධාන විෂයයන්, මාතෘ												
මාතෘකාවයන්(1)												
උපමාතෘකාවයන්/විෂය විෂයය ගාස්ත්‍ර												
විෂය විෂය අනුව වෙන්කිරීම්වල සාරාංශ ප්‍රතිඵල, වෙනසෙහි ඇස්තමේන්තු සහිත ප්‍රතිඵල සම්පාදන කළ	5											
1001 වැටුප් සහ වේතන	11	1,966,800,000	1,342,500,000	222,790,000	(13,309,000)	2,189,590,000	1,329,191,000	15,093,210	1,252,873,580	76,317,420	5.74	ලිඛිතවෙනස් කරණය සහ වියදම්වල ඇස්තමේන්තු ඉහළ මෙහෙ ඉල්ලීම සිදු වීම.
1002 අතිකාල සහ නිවාඩු දීන වැටුප්	11	35,300,000		2,459,000		37,759,000	33,409,721		33,409,721	4,349,279	11.52	* සහල් සමඟ දීමනා අදියරේ පරිවාරයන් වියදම් වාර්තාව අදියර් සඳහා ඇස්තමේන්තු කරන ලද අතිකාල සහ සන්නාම දීමනා ගණනය කිරීමේදී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 262

අමාත්‍යාංශය/අදහාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මංතර

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ මුලපෑම්		
		මුලික කරණ සංඛ්‍යා අංකය	විෂේශිත අයවැයෙන ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.ගෙ. 66/69 මාර්ග කිරීම්	මුළු ඉද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/අදහාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන් අනුව)	මුළු වියදම්	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තු මුදල් % ලෙස	වෙනස්කම්වලට හේතු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4) *100	
1101 දේශීය		11	27,800,000		3,628,000	31,428,000	28,954,099		28,954,099	2,473,901	7.87	ඔසප් කමදා දිනේ දෙවන අදියරේ පරිපාලන වියදම් වෙනස් වැය විෂයන් මගින් කළමණාකරණය කර ගන්නා ලදය අවශ්‍ය ජනාරාල්ගේ අංක BD/RE/118/50/2024 හා 2024.11.දින රජිත ලිඛිය මගින් දන්වා ඇති පරිදි ප්‍රතිපාදන ලදයා ගන්න ද එම ඉතිරිය හා සැළසුම් අංශයේ නිළධාරීන් සඳහා අවශ්‍ය ගමන් වියදම් සඳහා ලාභ ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රතිපාදන ලදසා ගන්න ද රිව අදාල ඉතිරියක් හා අවශ්‍ය වනුලේඛ 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම් හේතු කොටගෙන මෙම ඉතිරියක් සිදු විය.
1102 විදේශීය												
එකතුව (අ)			1,994,600,000	222,790,000	3,628,000	2,221,018,000	2,118,977,344	15,093,210	2,134,070,554	86,947,446		
සැපයීම්												
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		11	34,800,000		(4,000,000)	30,800,000	26,890,501		26,890,501	3,909,499	12.69	අවශ්‍ය වනුලේඛ 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම් නිසා සහ අඩාලරය අඩුවීමට සාපේක්ෂව වැඩදායක මිල ගණන් සැළකිය යුතු ලෙස අඩු වීම නිසා මෙම ඉතිරිය සිදු විය
1202 ඉන්ධන		11	41,400,000	-	(3,277,600)	38,122,400	28,571,574	-	28,571,574	9,550,826		
1202-002 ඉන්ධන දීමනාව		11	16,500,000			16,500,000	14,404,338		14,404,338	2,095,662	12.70	අවශ්‍ය වනුලේඛ 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම් නිසා සහ වත්මන්ත ඉන්ධන මිල අඩු වීම හා ඉන්ධන උකා ගැනීමට නිති නිළධාරීන් ස්ථාන මාරු වී යාම නිසා මෙම ඉතිරිය සිදු විය

ඵපිස්-2(ii)

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 262

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර

රු.

විෂය විෂයය	සවිස්තර	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධි මඟහැරීම		
		මුලික වෙන්කිරීම ස-ංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	ඩී.ආර්. 66/69 මාරු කිරීම් (3) (-)/+	මුළු ඉද්ධි ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පනතට අනුව වියදම (5)	ඩී.ආර්. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (හාස්ඩාගාර මුදිත සටහන් අනුව) (6)	මුළු වියදම (7)=(5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) ස-ංඛ්‍යාවික ඇස්තමේන්තු මුදලට % ලෙස (9)=(8)/(4) *100	වෙනස්කම්වලට හේතු
1202-009 ස-ේවක වාහන සඳහා ඉන්ධන		11	21,700,000		(249,600)	21,450,400	14,121,737		14,121,737	7,328,663	34.17	අයවැය වතුලේඛ 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම නිසා සහ වර්තමාන ඉන්ධන මිල අඩු වීම නිසා මෙම ඉතිරිය සිදු විය
1202-010 වෙනත් කටයුතු සඳහා ඉන්ධන		11	3,200,000		(3,028,000)	172,000	45,500		45,500	126,500	73.55	අයවැය වතුලේඛ 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම නිසා සහ වර්තමාන ඉන්ධන මිල අඩු වීම නිසා මෙම ඉතිරිය සිදු විය
1203-002 ආහාර සහ නිල ඇඳුම්		11	700,000			700,000	280,000.00		280,000	420,000	60.00	නිල ඇඳුම් තිම නිලධාරීන් සඳහා අපේක්ෂා කල පරිදි උසස් වීම් සිදු කොවිඩ සහ නිල ඇඳුම් තිම නිලධාරීන් ස්ථාන මාරු වී යාම නිසා මෙම ඉතිරිය සිදු විය.
1204 මෙවැදෑ සැපයීම්						-						

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 262

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර

රු.

විෂය විෂයය	සවිස්තර	ප්‍රතිපාදනය					වියදම			ඉදිරි බැලීම්		
		මුලික කරණ සංශෝධන අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.ගෙ. 66/69 මාර්ග කිරීම	මුළු ඉදිරි ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (හේතුවිය)	ඉතිරිය / (හේතුවිය) සංශෝධිත ඇස්තමේන්තු මුලට % ලෙස	මෙහෙයුම්වලට හේතු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4) *100	
1205 වෙනත්		11	100,000		(100,000)	-	-	-	-	-	-	නැත.
එකතුව (අ)			77,000,000	-	(7,377,600)	69,622,400	55,742,075	-	55,742,075	13,880,325		
කාඩ්ස්තු වියදම්												
1301 වාහන		11	25,000,000		(3,000,000)	22,000,000	16,502,565		16,502,565	5,497,435	24.99	අයවැය වත්කල්ප 01/02024 පරිදි අනාවරණය කළ යුතු සුළු අළුත් වැඩියාවන් සමඟක් සිදු කිරීම නිසා මෙම ඉතිරිය සිදු විය
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ		11	9,500,000			9,500,000	7,138,925		7,138,925	2,361,075	24.85	අයවැය වත්කල්ප 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම සඳහා අපේක්ෂා කල පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 16 යන්ත්‍ර හා තීන්තෝපකරණ සුළු අළුත් වැඩියා ඇති නොවීම නිසා මෙම ඉතිරිය සිදු විය
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	18,000,000			18,000,000	13,814,329		13,814,329	4,185,671	23.25	අයවැය වත්කල්ප 01/02024 පරිදි අනාවරණය කළ යුතු ගොඩනැගිලි සුළු අළුත් වැඩියාවන් සමඟක් සිදු කිරීම නිසා මෙම ඉතිරිය සිදු විය
1304 මිලදී ගැනීම් නඩත්තු		11	100,000			100,000	-		-	100,000	100	වසරියට අදාළ මිලදී ගැනීම්ට අවශ්‍යතාවයක් ඇති නොවීම නිසා මෙම ඉතිරිය සිදු විය.
එකතුව (ඇ)			52,600,000	-	(3,000,000)	49,600,000	37,455,819	-	37,455,819	12,144,181		
සේවා												
1401 ප්‍රවාහන		11	600,000		650,000	1,250,000	1,200,000		1,200,000	50,000	4.00	5% වඩා අඩු වීම
1402 නඩත්තු හා සන්නිවේදන		11	21,700,000		900,000	22,600,000	18,778,487		18,778,487	3,821,513	16.91	අයවැය වත්කල්ප 01/02024 අනුව වියදම් කළමණාකරණය කිරීම නිසා මෙම ඉතිරිය සිදු විය

එකතු-2(ii)

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 262

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් පාසලේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතර

	AI තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 01	වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානය-ගාල්ල	දේශීය	කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ දැනුම
වැලිපිටිය	Graphic Design සම්බන්ධ පුහුණු වැඩසටහන	01	දින 03	වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානය-ගාල්ල	දේශීය	Graphic Design සම්බන්ධ දැනුම
	ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 01		දේශීය	ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳ දැනුම
	මාතර නිතීඥ සංගමය මඟින් සම්බන්ධීකරණය කරදුන් මාධ්‍ය සාක්ෂරතාවය, ප්‍රචාරණය පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 01	මාතර ගඟ අද්දර හෝටලය	දේශීය	මාධ්‍ය සාක්ෂරතාවය, ප්‍රචාරණය පිළිබඳ දැනුම
	ධාරිතා සංවර්ධන වැඩසටහන	02	දින 03	ඇඹිලිපිටිය පුහුණු මධ්‍යස්ථානය	දේශීය	රාජකාරී කටයුතු ඉටුකිරීමේදී නිවැරදිව තීරණ ගැනීම, නායකත්වය හා විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම
	ධාරිතා	01	දින 03	අතුරුගිරිය	දේශීය	රාජකාරී කටයුතු

	සංවර්ධන වැඩසටහන			පුහුණු මධ්‍යස්ථානය		ඉටුකිරීමේදී නිවැරදිව තීරණ ගැනීම, නායකත්වය , විසඳුම් ක්‍රියාමාර්ග හා සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුම
	ගිණුම් පුහුණු වැඩසටහන	01	පැය 07	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර	දේශීය	ගිණුම් සැකසීම පිළිබඳව දැනුම
වැලිපිටිය	ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු වැඩසටහන	05	දින 01	නිල්දිය හෝටලය - මාතර	දේශීය	ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුම ලබා ගැනීම
	සිද්ධි කළමනාකරණ පුහුණු වැඩසටහන	01	දින 03	වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානය- ගාල්ල	දේශීය	අවධානම් සහිත පවුල් බලගැන්වීම පිළිබඳව දැනුම
	සෞඛ්‍ය ප්‍රවර්ධන පුහුණු වැඩසටහන	01	පැය 08	සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය	දේශීය	මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමට අදාළ දැනුම
	සබන් නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	19	පැය 05	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය, ආහාර වල ගුණාත්මක තත්වය වැඩැදියුණු කිරීම, ග්‍රාමීය කර්මාන්ත සවිබල ගැන්වීම
	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	9	පැය 04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	බිම්මල් වගාවේදි ඇතිවන ගැටලු පිළිබඳ දැනුවත් කිරීම
වැලිගම	අලුත් අවුරුදු පොළ පැවැත්වීම	12	පැය 06	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	නිෂ්පාදන අලෙවි අවස්ථා සලසා දීම
	පාවහන් සෑදීමේ පුහුණු වැඩසටහන	21	දින 04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, ග්‍රාමීය කර්මාන්ත සවිබල ගැන්වීම
	කරවල හා උම්බලකඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	8	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය, ආහාර වල ගුණාත්මක තත්වය වැඩැදියුණු කිරීම

වැලිගම	කුළුබඩු නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	8	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය, ආහාර වල ගුණාත්මක තත්වය වැඩැදියුණු කිරීම
	කුළුබඩු හා ආහාර නිෂ්පාදනයේ යෙදෙන්නන්ට ඇසුරුම්කරණය පළිබඳ පුහුණු වැඩසටහන	10	පැය 04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ආහාර හා කුළුබඩුවල ගුණාතමකභාවය සුරැකෙන පරිදි නැවුමුබවින් හා ආකාර්ෂණීය අයුරින් නිෂ්පාදන ඇසුරුම් කිරීම පිළිබඳ දැනුම ලබා දීම
	බූන්දි හා බයිට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	12	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය
	කේක් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	5	පැය 05	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	කාලීන ප්‍රවනතාවයන් අනුව නිෂ්පාදන හඳුන්වාදීම
	පන් ආශ්‍රිත නිර්මාණ පිළිබඳ පුහුණු වැඩසටහන	16	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	විදේශිය සංචාරකයින් ඉලක්ක කර ගනිමින් පන් ආශ්‍රිත නිෂ්පාදන නිර්මාණාත්මකව හා ආකර්ෂණියව නිෂ්පාදනය කිරීමට දැනුම ලබා දීම
	වටලප්පන් හා පුඩින් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	24	පැය 04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය
	ඖෂධීය බාම් වර්ග නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	12	පැය02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ග්‍රාමීය කර්මාන්ත නගාසිටුවීම
	ගමට සේවය වැඩසටහන යටතේ කුළුබඩු නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	19	පැය 05	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

වැලිඟම	ගැටුම් නිරාකරණය හා සමථකරණය පිළිබඳ වැඩසටහන	60	පැය 02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස ගැටුම් නිරාකරණය හා සමථකරණය, සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
	සමථකරුවන් පුහුණු කිරීමේ එක්දින වැඩසටහන	15	දින 01	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	සමථ මණ්ඩල පනත සහ එහි සංශෝධනයන්, සමථකරණ පියවර භාවිතය, සන්නිවේදන කුසලතා සහ ශිල්පක්‍රම භාවිතය පිළිබඳ සමථකරුවන් දැනුවත් කිරීම
	පාවහන් පුහුණු වැඩසටහන හා ප්‍රදර්ශනය	16	දින 02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	කාන්තාවන් සවිබල ගැන්වීම, ස්වයං රැකියා නොමැති කාන්තාවන් ස්වයං රැකියාගත කිරීම
	ඇසුරුම්කරණ වැඩසටහන	15	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	නිෂ්පාදන ඇසුරුම්කරණ ප්‍රමිතිය පිළිබඳ දැනුම
	මාස්මිලෝස් ජුජුබිස් නිෂ්පාදන පිළිබඳ වැඩසටහන	10	පැය 04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	ප්‍රාදේශිය විරැකියාව අවම කිරීම, ග්‍රාමීය කර්මාන්ත සවිබල ගැන්වීම
	නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	68	පැය 02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුම
	ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ වැඩසටහන	13	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	නව ප්‍රවණතා හඳුනාගැනීම හා ව්‍යවසායකයන් දැනුවත් කිරීම
	ව්‍යාපාරයට මග වැඩසටහන	8	පැය04	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	නව ව්‍යාපාර ආරම්භ කිරීම සම්බන්ධ දැනුම ලබා දීම

වැලිගම	මූල්‍ය සාක්ෂරතා වැඩසටහන	10	පැය 02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	මූල්‍ය සාක්ෂරතාවය සම්බන්ධව
	පොත් තැබීමේ වැඩසටහන	19	පැය 03	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	පොත් තැබීම සම්බන්ධ දැනුම
	සංස්කෘතික නිලධාරින්ගේ පුහුණු වැඩසටහන	89	පැය 02	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	කාර්යාල නිලධාරින්ගේ ආතති කළමනාකරණය
	2024 ජන හා නිවාස සංගණනයට අදාලව නිලධාරින් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන	80	පැය 06	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	සංගණන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම
	යෝග අභ්‍යාස වැඩසටහන	15	පැය 30	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදි	දේශීය	යෝග අභ්‍යාස සම්බන්ධ පුහුණුව
මුලවියන	දකුණු පළාත් දූෂන විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ නේවාසික පුහුනුව	01	03	අල්ලස් හා දූෂන විරෝධී කොමිෂන් සභාව	දේශීය	දූෂන විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ පුහුණුව
	මහජන සම්බන්ධතා හා පාරිභෝගික සත්කාර පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින01	වක්වැල්ල කළමණාකරණ සංවර්ධන පුහුණු ආයතනය (දකුණු පළාත) මඟින් පවත්වන ලදි	දේශීය	මහජන සම්බන්ධතා හා පාරිභෝගික සත්කාර පිළිබඳ දැනුම
	ලිපිගොනුකරණය,රාජකාරී ලිපි ලිවීම, රාජකාරී සටහන් ලිවීම, හා කාර්යාල කළමනාකරණ පුහුණු වැඩසටහන	01	දින 02	වක්වැල්ල කළමණාකරණ සංවර්ධන පුහුණු ආයතනය (දකුණු පළාත) මඟින් පවත්වන ලදි	දේශීය	ලිපිගොනුකරණය, රාජකාරී ලිපි ලිවීම, රාජකාරී සටහන් ලිවීම, හා කාර්යාල කළමනාකරණ පිළිබඳ දැනුම

මූලවියන	ගැටුම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 01	වක්වැල්ල කළමණාකරණ සංවර්ධන පුහුණු ආයතනය (දකුණු පළාත) මඟින් පවත්වන ලදි	දේශීය	ගැටුම් කළමනාකරණය පිළිබඳ දැනුම
	ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන	02	දින 01	දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය මඟින් පවත්වන ලදි	දේශීය	ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම
	ධාරිතා සංවර්ධන වැඩසටහන	02	Online		දේශීය	ආර්ථික විද්‍යාව,කළමණාකරණ ආදී බොහෝ විෂයන්
	සුපිලිපන් නිලධාරී පුහුණු වැඩසටහන	01	දින 01	අල්ලස් හා දූෂන විරෝධී කොමිෂන් සභාව	දේශීය	අල්ලස් හා දූෂනයෙන් තොර නිලධාරියක් ලෙස කටයුතු කිරීම පිලිබඳව
	ඩිජිටල් තාක්ෂණික පුහුණුව	01	දින 01	මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව මඟින්(දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)	දේශීය	ඩිජිටල් තාන්ෂනික පිළිබඳ දැනුම
	2024 ජන හා නිවාස සංගණනයට අදාල නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන	04	දින 02	ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලදි.	දේශීය	සංගණන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම
	2024 ජන හා නිවාස සංගණනයට අදාල ගණන් ගැනීමේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන	86	දින 06	ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලදි.	දේශීය	සංගණන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම
	සේවාස්ථ පුහුණුව	01	Online	රාජ්‍යපරිපාලන පළාත් සභා හා පළාත්	දේශීය	ආර්ථික විද්‍යාව,කාර්යාල කළමනිකරණ ආදී බොහෝ විෂයන්
	වෘත්තීය මාර්ගෝපදේශ	01	දින 01	මිනිස් බල හා රැකී රක්ෂා	දේශීය	වෘතීය මාර්ගෝපදේශය

	ය සම්බන්ධ පුහුනු වැඩසටහන			දෙපාර්තමේන්තුව මගින්(දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)		පිලිබඳ දැණුම
	තොරතුරු දැනගැනීමේ පනත	01	දින 01	මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)	දේශීය	තොරතුරු දැනගැනීමේ පනත පිලිබඳ දැණුම
මූලටියන	ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන	03	දින 02	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින්(කළාප අධ්‍යාපණ කාර්යාලය පල්ලිමුල්ල)	දේශීය	ඩිජිටල් අලෙවිකරණ පිලිබඳ දැණුම
	ව්‍යාපාර සැලසුම් සැකසීම	03	දින01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර	දේශීය	ව්‍යාපාර සැලසුම් කිරීම පිලිබඳ දැණුම
	නිලධාරී ධාරිතා පුහුණු සංවර්ධන වැඩසටහන	03	දින 01	තරුණ සේවා සභාව මාතර	දේශීය	වැඩ සැලසුම් කිරීම පිලිබඳ පුහුණුව
	අරුන්බර තාරුණ්‍යයට ඔවදනක්	50	එක්දින වැඩසටහන	දේශීය	දේශීය	තාරුණ්‍යයට අවශ්‍ය උපදේශනය ලබා දීම
අකුරුස්ස	සංවර්ධන නිලධාරී කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමේ පුහුණු වැඩමුළුව	60	පැය 30	දේශීය	දේශීය	මුදල්ක්‍රම ප්‍රසම්පාදනය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය
	විදුලි පරිපත නඩත්තු කිරීමේ පුහුණුව	01	දින 01	දකුණු පළාත් කළමණාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය	දේශීය	විදුලි පරිපත නඩත්තු කිරීම සම්බන්ධ දැනුම
	ඉඩම් ආදායම් ප්‍රවර්ධනය සඳහා නව්‍ය ප්‍රවේශයන් පිළිබඳ පූහුණු වැඩසටහන	01	දින 02	දකුණු පළාත් කළමණාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය	දේශීය	ඉඩම් ආදායම් ප්‍රවර්ධනය සඳහා නව්‍ය ප්‍රවේශයන් පිළිබඳ දැනුම
අතුරලිය	ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ පූහුණු වැඩසටහන	04	දින 01	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	දේශීය	ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ දැනුම
	කුරුඳු සැකසීම පිළිබඳ	30	දින 01	පලොල්පිටිය කුරුඳු	දේශීය	කුරුඳු සැකසීම පිළිබඳ දැනුම

	වැඩසටහන (ආර්ථික සංවර්ධන නිළධාරීන් සඳහා)			පර්යේෂණ ආයතනය		
	ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව	05	දින 01	තෙල්ජ්ජවිල කෘෂි පුහුණු මධ්‍යස්ථානය	දේශීය	ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව පිළිබඳ දැනුම
	අපනයනය සඳහා බිම්මල් වගා පුහුණු වැඩසටහන	02	දින 01	තෙල්ජ්ජවිල කෘෂි පුහුණු මධ්‍යස්ථානය	දේශීය	අපනයනය සඳහා බිම්මල් වගාව පිළිබඳ දැනුම
	මත් ද්‍රව්‍ය වලින් වැලකීම හා හඳුනා ගැනීම	01	දින 01	අන්තරායකර ඖෂධ පාලන ජාත්‍යන්තර මණ්ඩලය	දේශීය	මත් ද්‍රව්‍ය වලින් වැලකීම හා හඳුනා ගැනීම පිළිබඳ දැනුම
අතුරලිය	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	02	දින 02	බෝගහ පැලැස්ස පුහුණු මධ්‍යස්ථානය	දේශීය	ධාරිතා සංවර්ධනය පිළිබඳ දැනුම
	සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	04	දින 01	තිහගොඩ ප්‍රා.ලේ.කාර්යාලය	දේශීය	සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ පිළිබඳ දැනුම
	දහම් පාසල් ගුරු භවතුන් පුහුණු කිරීමේ වැඩසටහන	02	දින 04	දකුණු පළාත් කළමණාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය	දේශීය	දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ දැනුම
	ආපදා කළමණාකරණ නේවාසික පුහුණුව	01	දින 05	පුත්තලම වනාතවිල්ලුව පුහුණු මධ්‍යස්ථානය	දේශීය	ආපදා කළමණාකරණ පිළිබඳ දැනුම
	ආකල්ප සංවර්ධන පුහුණුව	02	දින 01	ගාල්ල ප්‍රා.ලේ.කාර්යාලය	දේශීය	ආකල්ප සංවර්ධන පිළිබඳ දැනුම
	ධාරිතා සංවර්ධන පුහුණුව	02	දින 02	බෝගහ පැලැස්ස පුහුණු මධ්‍යස්ථානය	දේශීය	ධාරිතා සංවර්ධන පිළිබඳ දැනුම
	පරිගණක අපරාධ වැලැක්වීම සම්බන්ධ පුහුණුව	02	දින 01	මාතර	දේශීය	පරිගණක අපරාධ පිළිබඳ දැනුම

	සංස්කෘතික හා ආගමික කටයුතු		පැය 03		දේශීය	සංස්කාතික හා ආගමික විෂයන්ට අදාල දැනුම
	ඉසව් කළමනාකරණය	04	පැය 03		දේශීය	ඉසව් කළමනාකරණය සම්බන්ධ දැනුම
	දැව පිළිබඳ රාජකාරි කටයුතු	04	පැය 06		දේශීය	දැව පිලිබඳ රාජකාරි කටයුතු
	ග්‍රාමීය කම්ටුවල - ග්‍රාම නිලධාරි කාර්ය භාර්ය	04	පැය 03		දේශීය	ග්‍රාමීය කම්ටු සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි කාර්ය භාර්ය
	දිළිඳු ජනතාවගේ ආර්ථික මට්ටම නංවාලීම	04	පැය 03		දේශීය	අස්වැසුම පිළිබඳ දැනුම
තිහගොඩ	මූල්‍ය කළමනාකරණය	04	පැය 03		දේශීය	මූල්‍ය කළමනාකරණය
	පරිවාස හා ළමා රක්ෂණ කටයුතු	04	පැය 03		දේශීය	පරිවාස හා ළමා රක්ෂණ කටයුතු
	ප්‍රජා සහභාගීත්ව සංවර්ධන ක්ටයුතු හා ව්‍යාපෘති සැළසුම් කිරිම.	04	පැය 06		දේශීය	ප්‍රජා සහභාගීත්ව සංවර්ධන කටයුතු හා ව්‍යාපෘති සැළසුම් කිරිම පිළිබඳ දැනුම්
	ව්‍යාපාර නාම ලියාපදිංචිය	04	පැය 06			ව්‍යාපාර නාම ලියාපදිංචිය
	ආදායම් බලපත්‍ර , ආදායම් සහතික නිකුත් කිරිම පිළිබඳ වැඩසටහන	04	පය 6		දේශීය	ආදායම් බලපත්‍ර , ආදායම් සහතික නිකුත් කිරිම පිළිබඳ වැඩසටහන
දෙවිනුවර	මහජනතාව අතර මූල්ය සාක්ෂරතාවය හා මූල්ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	05	දින 01	ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් පවත්වන ලදී	දේශීය	අදාළ ක්ශේත්‍ර නිලධාරීන් මඟින්, මහජනතාව අතර මූල්ය සාක්ෂරතාවය හා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම අරමුණ
	තොරතුරු පනත සම්බන්ධ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	04	දින 01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	තොරතුරු පනත සම්බන්ධයෙන් වූ වැඩිදියුණු කිරීම් තුළින් මහජනතාවට

						වඩාත් සඵලදායී සේවයක් සැපයීමේ අරමුණ
	උපදේශන නිලධාරීන් සඳහා සංඥා භාෂා පුහුණු වැඩසටහන	01	දින 12	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	කථන ආබාධ සහිත සේවාලාභීන් හට සංඥා භාෂාව පිළිබඳ වඩාත් ඵලදායී උපදේශන සේවාවක් සැපයීමේ අරමුණ
	බහුත්වවාදී සමාජයක රාජ්‍ය නිලධාරියාගේ කාර්යභාරය	22	දින 01	ශ්‍රී ලංකා සාම මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රහය හා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජාතික ඒකාබද්ධතා අංශයේ මෙහෙයවීමෙන්	දේශීය	නිලධාරීන් දැනුවත් කිරීම හරහා ජාතික හා ආගමික වශයෙන් අන්තර් සහයෝගීතාවයෙන් යුත් ජනතාවක් ඇති කිරීම
	සයිබර් ආරක්ෂණය පිළිබඳ මාතර දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන	05	දින 01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	කාර්යාල මට්ටමින් හා පෞද්ගලිකව සයිබර් ආරක්ෂිත වැඩ පිළිවෙලක් යොදාගැනීම පිළිබඳ ව කටයුතු කිරීම
දෙවිනුවර	පළාත් මට්ටමින් රාජ්‍ය ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශවලට අනුයුක්ත නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන	02	දින 01	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව උපදෙස් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හා කොන්ත්‍රාත් පරිපාලනයට අදාළව අභ්‍යන්තර විගණකවරුන් දැනුවත් කිරීම
	බැහැරගත පුහුණු වැඩසටහන අභිප්‍රේරණමය පුහුණු වැඩසටහන හා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉදිරි පස් වසරක උපාය මාර්ගික සැලැස්මක්	01	දින 03	දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලදී	දේශීය	දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉලක්ක හා කාර්යය සාධනය සාර්ථක කර ගැනීම

	සකස් කිරීම සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වූ සම්මන්ත්‍රණය					
දෙවිනුවර	වායු දූෂණය හා ඒ සම්බන්ධ සෞඛ්‍ය ගැටළු සහ ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය සම්බන්ධ දැනුවත් කිරීම/පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	02	දින 01	පරිසර අමාත්‍යාංශය මඟින් පවත්වන ලදී	දේශීය	ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයට අදාළව විවිධ ක්ෂේත්‍රයන් හා මහජනතාව දැනුවත් කිරීම
	ඵලදායිතා තත්ත්ව කව හා තත්ත්ව මෙවලම් පුහුණු වැඩසටහන (ආයතනගත පුහුණුව)	01	දින 02	දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මඟින් පවත්වන ලදී	දේශීය	ඵලදායිතා තත්ත්ව කව හා තත්ත්ව මෙවලම් අනුගමනය කිරීම තුළ යහපත් කාර්යාල පරිසරයක් ගොඩනැගීම
	මිනිස් වෙළඳාමට එරෙහිව කටයුතු කිරීම හා සුරක්ෂිත සංක්‍රමණය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහන	02	දින 01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	මිනිස් වෙළඳාමට එරෙහිව කටයුතු කිරීම හා ආරක්ෂිත සංක්‍රමණ වැඩපිලිවෙළක් ක්‍රියාත්මක කිරීම තුළ මහජනතාව අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් දැනුවත් කිරීම
	කාර්යාලයීය විදුලි උපකරණ නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන (ආයතනගත පුහුණුව)	01	දින 01	දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මඟින් පවත්වන ලදී	දේශීය	කාර්යාලයීය විදුලි බිල අවම කිරීම සඳහා අදාළ විදුලි උපකරණ භාවිතය
	මානසික සෞඛ්‍යය සතියට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් උපදේශන පිළිබඳ වැඩසටහන	01	දින 01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	රාජ්‍ය නිලධාරීන් සඳහා වැඩ පරිසරය ආශ්‍රිත සේවා නියුක්තිකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, වෘත්තීය අභිප්‍රේරණය ඉහළ නැංවීම,ගුණාත්මක සේවාවක් ලබාදීමට නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය හා

						මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම
	අනවසරයෙන් පහත්බිම් ගොඩකිරීම සම්බන්ධයෙන් වන නීතිමය රාමුව පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	01	දින 01	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් පවත්වන ලදී	දේශීය	අනවසර පහත් බිම් ගොඩකිරීමෙන් මහජනතාව වළක්වා ගැනීමේ අරමුණ
මාතර	නායකත්ව පුහුණුව, ගැටළු අවම කරගැනීමේ සහ ආකෘති කළමනාකරණ පුහුණු වැඩසටහන	117	2024.04.18 පෙ.ව.8.30 සිට ප.ව.1.00 දක්වා	නොමිලේ	දේශීය	නායකත්වය, ගැටළු අවමකර ගැනීම සහ ආකෘති කළමනාකරණය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම.
	ආයතන ක්‍රම සහ කාර්ය පටිපාටි ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	128	2024.05.02 පෙ.ව.9.00 සිට ප.ව.1.00 දක්වා	නොමිලේ	දේශීය	කාර්යාලීය ක්‍රම හා කාර්ය පටිපාටි පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම
	පරිගණක ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	12	2024.05.14 පෙ.ව.9.00 සිට ප.ව.1.00 දක්වා	නොමිලේ	දේශීය	කාර්යාලය තුළ පරිගණක භාවිතා කිරීම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම
මාලිම්බඩ	මත්ද්‍රව්‍ය නිවාරණ පිළිබඳ ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	27	පැය 2	දේශීය	දේශීය	මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුම
	ධාරිතා සංවර්ධන වැඩසටහන	60	පැය 4	දේශීය	දේශීය	ධාරිතා සංවර්ධනය පිළිබඳ දැනුම
	ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම	80	පැය 4	දේශීය	දේශීය	ආපදා කළමනාකරණය පිළිබඳ දැනුම
	සංගණන පුහුණු වැඩසටහන	60	පැය 3	දේශීය	දේශීය	දේශීය
	ගංවතුර ආපදා තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම	80	පැය 4	දේශීය	දේශීය	දේශීය
	මත්ද්‍රව්‍ය නිවාරණ	27	පැය 2	දේශීය	දේශීය	දේශීය

	පිළිබඳ දැනුවත් කිරීම.ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා					
	ප්‍රථමාධාර ලබාදීම පිළිබඳ පුහුණුව	80	පැය 6	දේශීය	දේශීය	දේශීය
	නායකත්වය හා පෞරුෂත්වය පිළිබඳ පුහුණු වැඩසටහන	60	පැය 8	දේශීය	දේශීය	දේශීය
හක්මණ	සිද්ධි හා අවස්ථා කළමණාකරන වැඩසටහන	92	පැය 3	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වන ලදී	දේශීය	කාර්යාලයේ දී උද්ගත වන ගැටලුවලදී ඒ සම්බන්ධව මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ දැනුම / කාර්යාලයේ උත්සව හෝ විශේෂ අවස්ථා සන්විධානය කිරීම පිළිබඳ පුහුණුව
	බෞද්ධ දර්ශනය පිළිබඳ දේශනය	85	පැය 3	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වන ලදී	දේශීය	මානසික සුවය හා සුවදායී ජීවිතයක් ගත කිරීම පිළිබඳ දැනුම හා අවබෝධය
	ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණු වැඩසටහන	76	පැය 3	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වන ලදී	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප කුසලතා සංවර්ධනය
	මහජන සබඳතා පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	98	පැය 3	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වන ලදී	දේශීය	කාර්යක්ශමව හා සඵලදායි සේවා සැපයීම පිළිබඳ දැනුම
	'තාල' රසවින්දන පුහුණු වැඩ සටහන	200	පැය 3	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වන ලදී	දේශීය	කාර්යාල නිලධාරීන්ගේ ආතති කලමනා කරණය
	ජන හා නිවාස සංගණනය පිළිබඳ පුහුණු වැඩ සටහන	45	පැය 24	ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව	දේශීය	සංගණන කටයුතු සිදුවීම පිළිබඳ පුහුණුව
	'රිදී සීනු' නත්තල් වැඩසටහන	150	පැය 6	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	දේශීය	ළමා රස වින්දනය

				හක්මණ		
	නිවරදි වචුවර් ඉදිරිපත් කිරීම පිළිබඳ පුහුණුව	60	පැය 6	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හක්මණ	දේශීය	අඩුපාඩු රහිත වචුවර් ඉදිරිපත් කිරීම
	Presentation skills ඉදිරිපත් කරීමේ කුසලා වර්ධනය	40	පැය 3	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-හක්මණ	දේශීය	ඉදිරිපත් කිරීමේ කුසලතා කළමනා කරනය කර ගැනීම
	කාර්යාල ක්‍රම හා ලිපි ගොනු කරණය පිළිබඳ පුහුණුව	34	පැය 3	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හක්මණ	දේශීය	කාර්යක්ෂම හා නිවැරදි දැනුම ලබා ගැනීම
කඹුරුපිටිය	කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා සන්නිවේදනය පිළිබඳ සියළු ආර්ථික සං.නි. දැනුවත් කිරීම.	33	දින 01	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	දේශීය	කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව සහ දැනුම ලබා ගැනීම
	ජීවිතාරක්ෂක ක්‍රමවේද සහ බෝට්ටු හා අගුල් පැදවීම පිළිබඳ පුහුණු වැඩසටහන	1	2	සේවි ද විල්රන් ආයතනය	දේශීය	ආපදා සහන සේවා නිලධාරින් ජීවිතාරක්ෂක ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීම
	සිවිල් ලියාපදිංචිය පිළිබඳ පිහුණු වැඩසටහන	5	දින 01	ලබුදුව-දක්ෂිණපාය	දේශීය	සිවිල් ලියාපදිංචිය පිළිබඳ අණපනත් වක්‍රෙල්ඛ පිළිබඳ දැනුම
	ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇතිවන හිංසනය වැලැක්වීමට අදාළ නිලධාරීන් දැනුවත් කිරීම	5	දින 01	ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය	දේශීය	අදාල සිද්ධි අධ්‍යයන වලදී යොමුකිරීම
	සෞඛ්‍ය ප්‍රවර්ධන පෙර පාසල් පුහුණු වැඩසටහන	1	දින 01	දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය-මාතර	දේශීය	සෞඛ්‍ය ප්‍රවර්ධන පෙර පාසල් 05 දැනුවත් කර වැඩසටහන් සකසා ක්‍රියාත්මක කිරීම
	ළමයින්ට එරෙහිව හිංසාව වැලැක්වීම සහ ළමා ආරක්ෂණය	1	දින 01	ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය	දේශීය	අදාල පවුල්වල දෙමාපියන් දැනුවත් කිරීම
	විද්‍යුත් ව්‍යාපාර නාම ලියාපදිංචිය පිළිබඳ පුහුණු	2	දින 01	වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානය	දේශීය	ව්‍යාපාර නාම පිළිබඳ විද්‍යුත් නාමකරණය පිළිබඳ දැනුවත් වීම

	වැඩසටහන					
	විද්‍යුත් ජාතික හැඳුනුම්පත් සකස් කිරීමට අදාළ පුහුණු වැඩසටහන	2	දින 01	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	දේශීය	විද්‍යුත් හැඳුනුම්පත් සකස් කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම
	බහු ආංශික පෝෂණ සැලැස්ම සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	1	දින 02	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මාතර	දේශීය	ප්‍රාදේශීය පෝෂණ සැලැස්ම සකස් කිරීමේ සම්පත් දියකත්වය සඳහා දැනුම ලබා ගැනීම
	ආබාධිතභාවය ජය ගන්නේ කෙසේද?	100	දින 02	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	දේශීය	අභිමි වීම ජීවිතයට ආශිර්වාදයක් කරගැනීම
	ඉගෙනීමේ කුසලතා සංවර්ධනය සහ අධ්‍යාපනයේදී දෙමාපියන් භූමිකාව	40	දින 01	සමාජ සවිබල ගැන්වීමේ හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	කඩින් කඩ පාසල් යන දරුවන් අඛණ්ඩව පාසල් ගත වී පාසල් අධ්‍යාපනයට යොමු කරවීම
	නිර්මාණාත්මක දරුවන් නිර්මාණය කර ගැනීමට දෙමාපිය කාර්යය	30	දින 01	සමාජ සවිබල ගැන්වීමේ හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	කුසලතා සංවර්ධනය
කඹුරුපිටිය	01) නිහඬ නොවන්න දරුවන් රැක ගනිමු (දරුවන් සඳහා) 02)දෙමාපියන් සඳහා	200 / 80	දින 02 දින 06	සමාජ සවිබල ගැන්වීමේ හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	අපයෝජන වළක්වා ගැනීම
	සංඥා භාෂා පුහුණු වැඩ සටහන	2	දින 15	රුහුණු සුමග ආයතනය	දේශීය	කතාකිරීමට නොහැකි අයට උපදේශනය ලබාදීම සංඥා භාෂාව මඟින් ලබාදීම
	නිරෝගිමත් වැඩිහිටි දිවියක් සඳහා සාහිත්‍ය රසවින්දනයේ වැදගත්කම	60	දින 1	සමාජ සවිබල ගැන්වීමේ හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	සීමාවකට කොටු වූ වැඩිහිටියන් තමන් සතු හැකියාවන් ඊළඟ දරුවන්ට කියාදීම
	පුද්ගල පෞරුෂත්වය සඳහා අධ්‍යාත්මික	80	දින 1 1/2	සමාජ සවිබල ගැන්වීමේ හා කාන්තා කටයුතු	දේශීය	මුළු ගැන්වී ඇති දරුවන් ඉදිරියට ගැනීම

	සංවර්ධනයේ වැදගත්කම			අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්		
	ඩිජිටල් මාර්කටින් පුහුණු වැඩසටහන	2	දින 2	ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	දේශීය	ඩිජිටල් මාර්කටින් පිලිබඳ දැනුම
	පූර්ණ ස්වයංක්‍රීය තාක්ෂණය යටතේ ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	4	දින 1	කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින්	දේශීය	ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව පිළිබඳ දැනුම
	කොට්ඨාසයේ බහු ආන්තික පුහුණු සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුව	40	දින 1	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	දේශීය	ප්‍රාදේශීය පෝෂණ සැලැස්ම සකස් කර දි.ලේ. කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම
	පෙරපාසල් සඳහා ඵලදායීතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ගුරුවරුන් හා දෙමාපියන්)	191	දින 10 (එක් පෙරපාසලකට එක් දිනය බැගින්)	ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත ඵලදායිතා නිලධාරීන් විසින්	දේශීය	වරින් වර ගොස් ඵලදායීතා සංකල්ප අනුව සකස් කර තිබේද කියා සොයා බැලීම
කඹුරුපිටිය	රාජ්‍ය අංශයේ ඵලදායීතාවය නව්‍යකාරණය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය බිබුළවෙල	56	දින 10	ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත ඵලදායිතා නිලධාරීන් විසින්	දේශීය	E certificate ලබාදීම. වෘත්තීය ක්ෂේත්‍ර සඳහා ලබාගත් දැනුම යොදා ගැනීම
	නිෂ්පාදන හා සේවා අංශය - හරිත ඵලදායිතා ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම.	10	දින 1	ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත ඵලදායිතා නිලධාරීන් විසින්	දේශීය	හරිත ඵලදායීතා සංකල්ප ව්‍යාපාරික අයතන වෙත යොදා ගැනීම
	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් පුහුණු කිරීමේ වැඩමුළුව	20	දින 1	ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත ඵලදායිතා නිලධාරීන් විසින්	දේශීය	ඵලදායිතා සංකල්ප ව්‍යාපාරික ආයතන වලට ආදේශ කර ගැනීම
	පුද්ගල	2	දින 1	සමෘද්ධි	දේශීය	පුද්ගල තොරතුරු

	තොරතුරු සුරක්ෂිත භාවය පිළිබඳ රාජ්‍ය නියෝජිත ආයතන පුහුණු කිරීමේ වැඩමුළුව			දෙපාර්තමේන්තුව		සුරක්ෂිතතා පනත පිළිබඳ දැනුවත් කිරීම
	ප්‍රජා අංශය - ගෘහස්ථ ඵලදායිතාවය පිළිබඳ දැනුවත් කිරීම	179	දින 01 (වසම් 09 ක් සඳහා)	ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත ඵලදායිතා නිලධාරීන් විසින්	දේශීය	ඵලදායීතා සංකල්ප ගෘහස්ථ ආයතනවලට යොදා ගැනීම
	සුරක්ෂා සංක්‍රමණය, තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම් මැඩපැවැත්වීම	2	දින 3	හෙල්විටාස් හා රාජ්‍ය නොවන සංවිධානය මඟින් (කම්කරු හා විදේශ සේවා නියුක්ති අමාත්‍යාංශය)	දේශීය	දැනුම ලබාගැනීම සහ බෙදා දීම
	ඩිජිටල් පුහුණු වැඩසටහන	2	දින 2	ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	දේශීය	Face Book Pag e එකක් සැකසීම.
කඹුරුපිටිය	Made in Sri Lanka දැනුවත් කිරීමේ වැඩසටහන	1	දින 1	ව්‍යවසාය සංවර්ධන අධිකාරිය	දේශීය	Made in Sri Lanka ලෝගෝව ලබාදීම පිළිබඳ දැනුවත් කිරීම
	ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන	28	දින 1	ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් විසින් නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ ප්‍රතිලාභීන් සඳහා	දේශීය	ආකල්ප සංවර්ධනය
	සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන පුහුණු වැඩසටහන- අකුරුගොඩ වසම	20	දින 1	ප්‍රතිපාදන - ව්‍යාවසාය සංවර්ධන අධිකාරිය සම්පත් දායකත්වය - විදාතා	දේශීය	සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම
	කේක් නිෂ්පාදන පුහුණු වැඩසටහන - මාපලාන මඟින් ඉහළ වසම	37	දින 1	ඩීවර හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින්	දේශීය	තාක්ෂණික පුහුණුව
	ඉටිපන්දම් නිෂ්පාදන පුහුණු	20	දින 2	දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන	දේශීය	තාක්ෂණික පුහුණුව

	වැඩසටහන - ගෝදාව වසම			කටයුතු අමාත්‍යාංශය		
	බෑග් සැකසීම පිළිබඳ පුහුණු වැඩමුළුව - ගෝදාව වසම	15	දින 3	දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	දේශීය	තාක්ෂණික පුහුණුව
	මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	60	දින 2	සහන සමාජ සංවර්ධන එකමුතුව	දේශීය	සංනිවේදනයේ ඇතිවන දුර්වලතාවයන් වළක්වා ගැනීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම
	ධාරිතා සංවර්ධනය පුහුණු වැඩසටහන	100	දින 2	ප්‍රජා පාදක නිශේධන දෙපාර්තමේන්තුව	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	ආකල්ප සංවර්ධනය පුහුණු වැඩසටහන	100	දින 1	ජාතික ඒකාබද්ධතා අංශය	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන	150	දින 1	ප්‍රජා පාදක නිශේධන දෙපාර්තමේන්තුව	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
කඹුරුපිටිය	බෝ නොවන රෝග පිටු දැකීමේ සායනික පරීක්ෂාව හා දැනුවත් කිරීමේ වැඩසටහන	51	දින 1	ආයුර්වේද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය- කඹුරුපිටිය මඟින්	දේශීය	බෝ නොවන රෝග වළක්වා ගැනීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම
	විගමණික පවුල් සඳහා පෙට්ටි මිරිස් වගාව පිළිව දැනුවත් කිරීම	19	දින 1	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින්	දේශීය	වගාක්‍රම හා හානි වළක්වා ගැනීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම
	සුරක්ෂිත සංක්‍රමණය පිළිබඳව දැනුවත් කිරීම	19	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	රාජ්‍ය නිලධාරීන් සඳහා වන ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් දැනුවත් කිරීම	36	දින 1	මහජන බැංකුව -කඹුරුපිටිය	දේශීය	රාජ්‍ය නිලධාරීන් සඳහා වන ණය යෝජනා ක්‍රම සම්බන්ධ දැනුම
	සුරක්ෂිත සංක්‍රමණය සම්බනධයෙන් දැනුවත් කිරීම	36	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම

				අනුයුක්ත සං.නි. විසින්		
	වාණිජ බිම්මල් වගාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම	12	දින 1	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	සුරක්ෂිත සංක්‍රමණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	12	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	නව විදේශ රැකියා අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීම	27	දින 1	විදේශ රැකියා දිස්ත්‍රික් සම්බන්ධීකාරක -මාතර	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	සුරක්ෂිත සංක්‍රමණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	27	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් දැනුවත් කිරීම	19	දින 1	ප්‍රතිභා මීඩියා නෙට්වර්ක් - කඹුරුපිටිය	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
කඹුරුපිටිය	සුරක්ෂිත සංක්‍රමණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	20	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	මිනිස් වෙළඳාම සම්බන්ධයෙන් දැනුවත් කිරීම	46	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම සම්බන්ධයෙන් දැනුවත් කිරීම	25	දින 1	ප්‍රතිභා මීඩියා නෙට්වර්ක් - කඹුරුපිටිය	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	සුරක්ෂිත සංක්‍රමණය සම්බන්ධයෙන් ගෙයින් ගෙට දැනුවත් කිරීම	8	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	විගමණික පවුල්වල සාමාජිකයින්	20	දින 1	කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය-	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම

	සඳහා ඇඟළුම් නිෂ්පාදන වැඩසටහන			කඹුරුපිටිය ප්‍රා.ලේ.කා		
	තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම.	10	දින 1	ප්‍රතිභා මීඩියා නෙට්වර්ක් - කඹුරුපිටිය	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	විගමණික පවුල්වල සාමාජිකයින් සඳහා පිරිවැයකරණ වැඩසටහන	20	දින 1	කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය- කඹුරුපිටිය ප්‍රා.ලේ.කා	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	සුරක්ෂිත සංක්‍රමණය පිළිබඳව දැනුවත් කිරීම	20	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
කඹුරුපිටිය	සුරක්ෂිත සංක්‍රමණය සහ ගැටළු හඳුනාගැනීම සඳහා ගෙයින් ගෙට ඇවිදීමේ වැඩසටහන	18	දින 1	විදේශ කටයුතු, විදේශ රැකියා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සං.නි. විසින්	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	රාජ්‍ය නිලධාරීන් සහ විගමණික පවුල් සාමාජිකයින් සඳහා බෝවන රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	20	දින 1	සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය - මාතර	දේශීය	ප්‍රජාව දැනුවත් කිරීම
	කළමනාකරණ සේවා නිලධාරීන් (1 පන්තිය) සඳහා වන පුහුණු වැඩසටහන	1	දින 10	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- ගාල්ල	දේශීය	ආයතන ක්‍රම, ශිණුම් ක්‍රම, මුදල් රෙගුලාසි, රජයේ චක්‍රලේඛ හා අනපනත් පිළිබඳ දැනුවත් කිරීම
	ප්‍රා.ලේ. කාර්යාලවල රියදුරන් සඳහා පැවති පුහුණු වැඩසටහන	2	දින 1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- මාතර	දේශීය	
කොටපොල	ඵලදායිතා සංකල්පය පිළිබඳ මූලික හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහන	25	පැය 04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී	දේශීය	ඵලදායිතාව පිළිබඳ දැනුම
	5S සංකල්පය	80	පැය 04	ප්‍රාදේශීය	දේශීය	5S සංකල්පය හා

	හා ගෘහස්ථ ඵලදායිතාව පිළිබඳ පුහුණු වැඩසටහන			ලේකම් කාර්යාලය මඟින් පවත්වන ලදී		ගෘහස්ථ ඵලදායිතාව පිළිබඳ දැනුම
	රජයේ නිලධාරීන් අන්‍ය ජාතීන් සඳහා සේවා සැපයීමේදී කටයුතු කල යුතු ආකාරය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	60	පැය 08	ජාතික සාම මණ්ඩලය මඟින් පවත්වන ලදී	දේශීය	රජයේ නිලධාරීන් අන්‍ය ජාතීන් සඳහා සේවා සැපයීමේදී කටයුතු කල යුතු ආකාරය පිළිබඳ හා පවතින නීතිරීති පිළිබඳ දැනුම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය(අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමටයෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6.	වෙනත්	අදාල නොවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9.	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදී බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	රේඛීය අමාත්‍යාංශවලට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල විගණන විමසුම් වලදී එම අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය කරමින් පිලිතුරු සකස් කිරීමට සිදුවීමේදී ලබාදෙන කාලය ප්‍රමාණවත්	

			නොවීම	
6	අභ්‍යන්තර විගණනය			
6.1.	මු.රෙ.134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1.	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	වත්කම් කළමනාකරණය			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම	අනුකූල වේ		

	මු.රෙ.772 අනුව සිදු කිරීම.			
9	වාහන කළමනාකරණය			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.		
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2.	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකුගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම.	අනුකූල වේ		
11.2.	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට ඵලඹීම.	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1.	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳකාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත	අනුකූල වේ		

	එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.			
13	පොදු තැන්පත් ගිණුම			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2.	රැස් කර තිබූ ආදායම්,තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3.	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් නිලධාරීන්ට පත්වීම් ලබා දීම.	අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු	අනුකූල වේ		

	ලිඛිතව ලබා දී තිබීම.			
16.3.	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	පූරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1.	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	1/2024 චක්‍රලේඛය පරිදි අත්‍යවශ්‍ය වශයෙන් වියදම් දැරිය යුතු පුහුණු වැඩසටහන් වෙනුවෙන් පමණක් තව දුරටත් වියදම්	

			දැරීම හේතු කොට ගෙන පොදුවේ සියලු නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවන් නොපැවැත්වීම	
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SPCG/MT/A/DSFS/2/24/12 මෙම අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 29 දින

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මාතර

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එන්.එම්.එස්. ආනන්ද

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත 1. අධ්‍යක්ෂ ජනරාල්-රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කා.දැ.ස හා අ.ක.ස

2. ලේකම් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය-කා.දැ.ස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SPCG/MT/A/DSFS/2/24/12 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 29 දින

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතර

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනනි රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනනි රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ නත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදළව සිදුකල සෝදිසි විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වෙළඳපොල වටිනාකම පිළිවෙලින් රු.6,000,000 ක් හා රු. 400,000 ක් වූ අංක PC-5064 දරන ඩබල් කැබ රථය හා අංක JY-6559 දරන ත්‍රිරෝද රථය ගිණුම්ගත කර නොතිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුළු වත්කම් රු.6,400,000 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් එකතුව හෙක්ටයාර් 13.183 ක්වූ ඉඩම් හා එකතුව වර්ග මීටර් 8,256 ක්වූ ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 ජුනි 28 දිනැති හා අංක 01/2017 දරන භාණ්ඩාගාර ලේකම් වක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතන සතු වත්කම් ගිණුම්ගත කිරීම අත්‍යවශ්‍ය බව සඳහන්ව තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අයත් ඉඩම්, ගොඩනැගිලි හා වාහන සම්බන්ධ 2024 දෙසැම්බර් 31 දිනැති සිගාස් වාර්තාව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබූ වාර්තාව අතර රු.349,700,377 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරී ප්‍රගති සමාලෝචන රැස්වීම් 08 ක් පවත්වා ඒ වෙනුවෙන් රු.126,440 ක් වියදම් කර තිබුණු නමුත් එකදු ප්‍රගති සමාලෝචන රැස්වීමක හෝ රැස්වීම් වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බැවින් ප්‍රගති සමාලෝචන රැස්වීම මගින් ලබාගත් නින්දු තීරණ හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හෝ අදාළ රැස්වීම්වල සඵලදායී බව සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකි විය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 804(2) ප්‍රකාරව එක් දෙපාර්තමේන්තුවකින් තවත් දෙපාර්තමේන්තුවකට නිකුත් කරන භාණ්ඩ සම්බන්ධයෙන් නිකුත් කිරීම් හා ලැබීම් නියෝග අනුව කටයුතු කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) මාතර, වැලිගම හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ පවතින ඉඩම්වලින් රජයේ ඉඩම් වෙන්කර හඳුනාගැනීමට හා රජයේ ඉඩම් ලේඛනගත කිරීමට සිදු නොවීම හේතුවෙන් 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 180 හි දක්වා ඇති කාර්යයන් හා විධිවිධානයන් ඉටුකිරීමට නොහැකි වී ඇති බවට නිරීක්ෂණය වූයෙන් ආළ බල ප්‍රදේශ තුළ පිහිටි ඉඩම් මනා ලෙස කළමනාකරණය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 341 ප්‍රකාරව උපපත්‍රිකා පොත් ලැබීම හා ඒ පිළිබඳ ක්‍රියා සටහන් කර ගැනීම සඳහා ඒ.ඇන් 20 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු නොකළ ආදායම් බලපත්‍ර 2000 ක් හා ගැබිනි මාතා පෝෂණ දීමනා මුද්දර 200 ක් පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවේ තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්ථන වැය විෂයයන් 19 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.5 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී නිබුණු අතර මූලධන වැය විෂයය 05කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 72 ක පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී නිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 12 කින් සියයට 1.84 සිට 113 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් දරා නිබුණු අතර වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 0.95 සිට සියයට 12 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර නිබුණි.

(ඇ) 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 "අ" අනුරු විධානය යටතේ විවිධ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් එකතුව රු.760,857,627 ක්වූ පොලී මුදලක් ගෙවීමට සිදු වී නිබුණු අතර, අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණු භාවිතා කර නොනිබුණු බැවින් අදාළ වියදම් නිෂ්කාර්ය හා අවිධිමත් වියදම් වී නිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි සිගාස් ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කළයුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැය විෂයයන් 05 කට අදාළව එකතුව රු.714,021 ක්වූ බැරකම් ද මාතර, කඹුරුපිටිය, කිරින්ද පුහුල්වැල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව විෂයයන් 06 ක එකතුව රු.394,258 ක්වූ බැරකම් වශයෙන් එකතුව රු.1,108,279 ක්වූ බැරකම් නව සිගාස් පද්ධතිය මගින් ජනනය කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශය යටතේ වාර්තා කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගේ 2024 දෙසැම්බර් මාසයේ ගෙවිය යුතු රු.7,864 ක්වූ අතිකාල දීමනාව 2025 ජනවාරි මාසයේ අංක P -2501038 දරන ගෙවීම් වවුචරය මගින් ගෙවා තිබුණද, ඒවා බැරකම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම් අංක (iii) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් වුණු බැරකම් රු.458,858 ක් භාණ්ඩාගාර සටහන් අංක SA 92 හි ඇතුළත් බැරකම් රු.454,738 ක් ලෙස දැක්වා තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම II හි ඇතුළත් රු.4,120 ක් වූ බැරකමක් භාණ්ඩාගාර සටහන්වල ඇතුළත් නොවීම නිසා භාණ්ඩාගාර සටහන් හා මූල්‍ය ප්‍රකාශන බැරකම් අතර රු.4,120 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 14කින්, දෙපාර්තමේන්තු 11 කින් හා අනෙකුත් ආයතන 02 කින් ලැබී තිබුණු එකතුව රු.111,181,222 ක්වූ ප්‍රතිපාදනවලින් එකතුව රු. 81,779,610 ක් පමණක් වියදම් කර තිබුණු බැවින් එකතුව රු.29,401,612 ක් හෙවත් මුළු ලැබුණු ප්‍රතිපාදනවලින් සියයට 26ක් ඌන උපයෝජනය වී තිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය මගින් ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය දියුණු කර ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමේ ගෘහාශ්‍රිත එළුවන් ඇතිරීමේ වැඩසටහන වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක ප්‍රතිලාභීන් 64 දෙනෙකු වෙනුවෙන් එළුවන් 192 ක් මිලදීගෙන ලබාදීමට රු.4,410,150 ක් වැයකර තිබුණි. ප්‍රතිලාභීන්ට බෙදාදුන් එළුවන්ගෙන් ප්‍රමාණවත් පරිදි කිරි නොලැබීම, සතුන් මියයාම, පැටවුන් බිහිකිරීම අවම වීම හා බිහිකරන ලද පැටවුන්ගේ වර්ධනය ඉතා පහළ මට්ටමක පැවතීම නිසා ව්‍යාපෘතියේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ළඟාකර ගැනීමට නොහැකි වීමෙන් අදාළ ව්‍යාපෘතියේ වියදම් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) පරිසර අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මගින් පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ ප්‍රතිලාභියෙකු විසින් වසරකට තවාන් පැළ 5000 ක් බැගින් වසර 03 ක් තුළදී තවාන් පැළ 15000 ක් නිෂ්පාදනය කර පරිසරයට මුදාහැරීම තුළින් පරිසර සංරක්ෂණය හා වන වැස්ම වැඩිකිරීම ඉලක්ක කර ගැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක ප්‍රතිලාභීන් 21 ක් සඳහා එකතුව රු.6,075,000 ක් ගෙවා තිබුණි. ප්‍රතිලාභීන් සමග ඇතිකරගත් ගිවිසුමේ 2.5 වගන්තිය ප්‍රතිලාභීන් විසින් වසර 03 අවසානයේදී නිශ්පාදනය කළ යුතු මුළු පැළ ප්‍රමාණය 345000 කින් පැල 176969 ක ප්‍රමාණයක් හෙවත් මුළු පැල ප්‍රමාණයෙන් සියයට 51 ක් නිෂ්පාදනය කර නොතිබුණු බැවින් වැඩසටහනේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ළඟාකර ගැනීමට නොහැකි වූයෙන් අදාළ වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

(ඈ) මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2024 අප්‍රේල් 04 දිනැති හා අංක DFD/2004-1 දරන වක්‍රලේඛය ප්‍රකාරව අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල පෝෂණ මට්ටම පවත්වා ගැනීමට සහාය ලබාදෙමින් එක් පවුලකට මසකට සහල් කිලෝ ග්‍රෑම් 10 ක් වන පරිදි මාස 02 ක කාලයක් සඳහා සහල් ලබාදීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් අදියර 2 ක් යටතේ සහල් කිලෝග්‍රෑම් 2,579,400 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, පාරිභෝගික අධිකාරිය විසින් ලබාදුන්, මිල වාර්තා අනුව අදාළ කාලයේදී වෙළඳපොලේ සහල් කිලෝග්‍රෑම් 1 ක සිල්ලර මිල රු.150 ත් 165 අතර අගයක පැවතුණු අතර, ඒ පිළිබඳ සලකා බැලීමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සහල් කිලෝග්‍රෑම් 01 ක් රු.186 ක්වූ වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් රු.54,540,680 ක්වූ මූල්‍ය පාඩුවක් රජයට සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ඉකුත් වර්ෂයේදී කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශය විසින් ලබාදුන් රු.233,166 ක ප්‍රතිපාදන මත මාතර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබුණු කුරුඳු ආශ්‍රිත අගය වැඩිකිරීමේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 40 ක් පුහුණු කර නිෂ්පාදන ක්‍රියාවලියක් තුලින් කුරුඳු ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන විවිධාංගිකරණයන් බිහිකිරීම හා කුරුඳු ආශ්‍රිත නව අගය එකතු කිරීමේ ගුණාත්මක නිෂ්පාදනයන් බිහිකිරීමට කටයුතු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වී තිබුණද, ඊට අනුකූලව කටයුතු කිරීමට ප්‍රතිලාභීන් කටයුතු කර නොතිබුණු බැවින් අදාළ වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

(ඊ) වේවැල්, පිත්තල, මැටි, ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වැලිගම හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගෙන තිබුණු ප්‍රතිලාභීන් 78 කින් ප්‍රතිලාභීන් 25 ක් සක්‍රීය ව්‍යවසායකයින් ලෙස කටයුතු කර නොතිබුණු බවට නිරීක්ෂනය වූයෙන් ව්‍යාපෘතියේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණු බැවින් වැයකර තිබුණු එකතුව රු.1,527,080 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

(උ) සමෘද්ධි ගෘහ ආර්ථික, මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මාතර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 51 ක් වෙනුවෙන් පාවහන් නිෂ්පාදනය ආරම්භ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක රු.45,000 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු අතර, ඉන් ප්‍රතිලාභීන් 25 දෙනෙකු පාවහන් නිෂ්පාදනයෙන් ඉවත් වී තිබුණු බැවින් අදාළ පුහුණු වියදම් හා ඇගළුම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රජයේ දායකත්වය රු.31,950 ක් වැයකර ප්‍රතිලාභියෙකුට ලබා දී තිබුණු ජූකී මැෂිමක් වසර 02 කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණු බැවින් අදාළ වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

(ii) මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබුණු කුරුඳු නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.3,000,000 ක් වැයකර ප්‍රතිලාභීන් 30 ක් සඳහා බෙදා දී තිබුණු කුරුඳු බෙල්

කිරීමේ යන්ත්‍ර වසර 03 ක කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. එසේම ප්‍රතිලාභීන් 05 දෙනෙකුට රු.500,000 ක් වැයකර ලබාදුන් බෙල් කිරීමේ යන්ත්‍ර, බාහිර පාර්ශවයන්ට විකුණා ව්‍යාපෘති ගිවිසුම් කඩකර තිබුණු නමුත් යන්ත්‍ර මිලදී ගැනීමට රජය විසින් වැයකර තිබුණු රු. 500,000 ක් ගිවිසුම් ප්‍රකාරව ප්‍රතිලාභීන්ගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් රජයට මූල්‍ය අලාභ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සමෘද්ධි හා අඩු ආදායමලාභී පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් වැඩසටහනේ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වැඩසටහන යටතේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 11 ක ප්‍රතිලාභීන් 20 ක් සඳහා රජයේ දායකත්වය රු.723,453 ක් වැයකර ලබාදී තිබුණු උපකරණවල වටිනාකම් ගිවිසුම් ප්‍රකාරව ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් රජයේ වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි. එසේම ව්‍යාපෘතිය යටතේ ජීවන තත්වය නගා සිටුවීම වෙනුවෙන් ප්‍රතිලාභීන් 23 ක් සඳහා රජයේ දායකත්වය රු.809,510ක් වැයකර උපකරණ ලබාදී තිබුණද, අදාළ උපකරණ නිශ්කාර්යව පැවතීම හා අදාළ ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය වැඩිදියුණු නොවීම මත අස්වැසුම් සහනාධාර ලබාගන්නා බව නිරීක්ෂණය වූයෙන් අදාල වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

(ii) පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභියෙකුට ලබා දී තිබුණු අධි ශීතකරණයක් ප්‍රතිලාභියාගේ නිවසේ නොතිබුණු බවත් එය ප්‍රතිලාභියා විසින් ව්‍යාපාරය සඳහා භාවිතා නොකරන බවත් නිරීක්ෂණය වූයෙන් ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව අධි ශීතකරණය මිලදී ගැනීමට රජය විසින් වැයකර තිබුණු රු.50,000 ක් ප්‍රතිලාභියාගෙන් ආපසු අයකර නොගැනීම නිසා රජයට අලාභ සිදුකර තිබුණි.

(iii) අකුරැස්ස හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් 39 ක් සඳහා රජයේ දායකත්වය රු.1,191,800 ක් වැයකර ලබාදුන් උපකරණ අරමුණුගත කාර්යයන්ට භාවිතා නොකර දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබීමට හා අබලන්වීමට ඉඩහැර තිබුණු බැවින් රජයේ වියදම් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

(එ) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අකුරැස්ස ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට පදනම් වූ නිර්ණායක හෝ ප්‍රතිලාභීන් ඇගයීම් වාර්තා, තොරතුරු හා සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ විනිවිදභාවයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම එක් එක් ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව ප්‍රතිලාභීන් විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් කර නොතිබුණද, ඒ පිළිබඳ සැලකිමෙන් තොරව 2024 දෙසැම්බර් මාසයේ ප්‍රතිලාභීන්ගේ නමින් එකතුව රු.2,036,250 ක්වූ චෙක්පත් ලියා දින 14 ත් දින 36 ත් අතර කාලයක් විෂය ලිපිකරු විසින් අත රඳවාගෙන තිබුණි.

(ඒ) "දශවිධ කඳුකර දශකය 2024 – 2033" විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ජනාධිපති ලේකම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ අංක 02 හි දැක්වෙන දශවිධ සංවර්ධන අංශවලට අදාළ ඇමුණුම 02 ට අයත් අංක 02 දරන උප ක්ෂේත්‍රයට අනුව අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ක්ෂේත්‍රයන් 05 ට ඇතුළත් නොවූ වැඩසටහනක් වෙනුවෙන් එනම් පෙර පාසල් 18 ක් සඳහා අඟල් 43 Smart TV මිලදී ගැනීමට එකතුව රු.1,852,020 ක් වැයකර තිබුණු අතර, ඒ තුළින් ව්‍යාපෘතියේ අරමුණු වූ බහුමාන දරිද්‍රතා දර්ශකයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය විසින් රජයේ අනුමත ණය යෝජනා ක්‍රමයක් නොවූ එනම් හරිතාගාර ඉදිරිකරදීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 05 ක් සඳහා ණය මුදල් නිදහස් කිරීම යටතේ හරිතාගාර ගෘහය ඉදිකිරීමට අදාළ අනුමත වියදම් ඇස්තමේන්තුවක් හෝ ඉදිකිරීම් සැලැස්මක් හෝ රජයේ වගකිව යුතු තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණයක් හෝ නොමැතිව හරිතාගාර ඉදිකිරීම වෙනුවෙන් සැපයුම්කරුවෙකු වෙත එකතුව රු. 5,000,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අදාළ ණය මුදල් ප්‍රතිලාභීන්ට නිකුත් කළ බවට ණය ලිපි ලේඛන සකස් කර තිබුණු බවත්, ප්‍රතිලාභීන්ට ණය මුදල් ලැබී නොතිබුණු බැවින් ඔවුන් විසින් ණය වාරික ගෙවීම් පැහැර හැර තිබුණු බවත් නිරීක්ෂණය වූයෙන් එකතුව රු. 4,184,500 ක්වූ හිඟ ණය ශේෂයක් තවදුරටත් අයවීමට පැවතුණි.

(ඔ) බහුකාර්යය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 අප්‍රේල් 04 දිනැති හා අංක MGTE/mgt/Admin/14/23 දරන ලිපියෙන් රෂයේ ආයතනවලට නිදහස් කරන නිලධාරීන් නවදුරටත් බහුකාර්ය සංවර්ධන කාර්යය සහායකයින් ලෙස කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බවත්, ඔවුන්ගේ පුහුණු පත්වීම අවසන් කලාසේ සළකා කටයුතු කළයුතු බව දන්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර ඔවුන් වෙනුවෙන් ගෙවා තිබුණු එකතුව රු.3,240,046ක් වූ වැටුප් හා දීමනා නිෂ්කාර්යය වියදම් වී තිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයන් සිදුකර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය		
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	ව්‍යවස්ථාපිත විධිවිධාන		
(i)	2018 අංක 19 දරන ජාතික විගණන පනත	අදාල නොවේ.	පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව 2022 හා 2023 වර්ෂ සඳහා නිකුත් කරනු ලැබූ වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ii)	1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය නැවත ලබා ගැනීමේ පනත	අදාල නොවේ.	• මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු මූ.පි.මාර 1697 හි 5 වැනි බිම් කැබැල්ල පර්චස් 8.4 කොටසක් අනවසරයෙන් බුක්ති විඳින නමුත් එහි සන්තකය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. • කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහළ විටියල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පර්චස් 81 ක ඉඩමෙන් පර්චස් 66.58 ක ප්‍රමාණයක් අනවසරයෙන් රබර් වගා කර ඇති අතර එය නියමානුකූල කිරීමට හා උල්ලල මාස්මුල්ල ප්‍රජා ශාලාව තුළ වසර 06 කට ආසන්න කාලයක සිට බුක්ති විඳින පුද්ගලයා එම ප්‍රජා ශාලාවෙන් ඉවත් කිරීමට හෝ ඔහුට ජීවත්වීමට අවශ්‍ය ඉඩමක් ලබාදීමට ඉඩම් කච්චේරි වෙත යොමු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iii)	2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත	අදාල නොවේ.	වැලිගම කොට්ඨාශයේ පොල්වතුමෝදර ග්‍රාම නිලධාරී වසමේ කන්දපාමුලවත්ත සුනාමි නිවාස සංකීර්ණය හෙක්ටයාර 0.4614 ක භූමි ප්‍රමාණයක තට්ටු හා බද්ධ නිවාස ආකාරයට ඉදිකර 2007 වර්ෂයේදී නිවාසලාභීන් වෙත භාරදී තිබූ අතර මහල් හතරකින් සමන්විත ගොඩනැගිලි 03 හි නිවාස ඒකක 28 කින් සමන්විත මෙම සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතිය ලියාපදිංචි කිරීමේ කටයුතු හා දීමනා පත්‍ර නිකුත් කිරීමේ කටයුතු පනත යටතේ 2023 අගෝස්තු 14 දිනෙන් අවසන් වී තිබුණු අතර නිවාස ව්‍යාපෘතිය සහාධිපත්‍ය දේපලක් ලෙස ලියාපදිංචි කර නිවාසලාභීන් වෙත විධිමත් ඔප්පු සකස් කර ලබාදී නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10.1 වගන්තිය	1,847,369	කොටපොල, වැලිගම හා පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය නොමැතිව විධායක නිලධාරීන් පමණක් එදිනෙදා කළයුතු, දෙපාර්තමේන්තු වැඩ වෙනුවෙන් තනිවම නිවාඩු දින ක්ෂේත්‍ර රාජකාරි ඉටුකර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා නිවාඩු දින වැටුප් ලබාගෙන තිබූ අතර ඉටුකළ රාජකාරි වශයෙන් ඉඩම් පරීක්ෂාව, ව්‍යාපෘති පරීක්ෂාව ලෙස දක්වා තිබුණද, එම ක්ෂේත්‍ර රාජකාරි සඳහා විෂයට අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් සහභාගී වී නොතිබුණි. තවද නිවාඩු දින ක්ෂේත්‍ර රාජකාරි ඉටුකිරීම්වලට අදාළ ලිඛිත වාර්තා හෝ සාක්ෂි නොතිබුණු බැවින් නිවාඩු දින වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i)	මුදල් රෙගුලාසි 136,137,138 හා 139	482,753	මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබුණු නිල්වලා නගර සංවර්ධන වැඩසටහනේ රු.1,303,409 ක්වූ පරිපාලන වියදමෙන් රු.482,753 ක් දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් 20 දෙනෙකුගේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ව්‍යාපෘතියෙන් පරිබාහිර රාජකාරි ගමන් වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දිමනා ගෙවා නිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 177(1)	58,930	රජයේ දේපළ බදුදීමෙන් උපයන ආදායම් රාජ්‍ය ආදායමට බැර කළයුතු වුවත් වැලිගම, පිටබැද්දර හා මුලටියන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ආපනශාලා බදු කුලී ආදායම් රාජ්‍ය ආදායමට බැර නොකර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සුභසාධක අරමුදලට බැර කර තිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 758	අදාල නොවේ.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක නැතහොත් ශාඛා කාර්යාලයේ ස්ථාන ප්‍රධානියා නොහොත් කාර්යභාර නිලධාරියා විසින් ඉඳහිට එහෙත් යටත් පිරිසෙයින් තෙමසකට වරක්වත් බඩු ලේඛන වවුචර සමඟ සසඳා බඩු ලේඛන පොත පරීක්ෂණ සෝදිසිවලට භාජනය කිරීමට ද, තොග ශේෂයන් සමඟ සසඳා ඇත්ත වශයෙන්ම තොගයෙහි ඇති භාණ්ඩ කිහිපයක් හරි වැරදි බැලීම ද කළයුතු වුවත් එසේ සිදුකර නොනිබුණි.

(ඇ)	ජනාධිපති ලේකම්ගේ 2020 සැප්තැම්බර් 15 දිනැති හා අංක PS/GPA/Circular/29/2020 දරන චක්‍රලේඛය	අදාල නොවේ.	2024 නොවැම්බර් 18 සඳුදා දින කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල ග්‍රාම නිලධාරී කාර්යාල 08 ක් පිළිබඳව සිදුකළ භෞතික පක්ෂාවේදී ග්‍රාම නිලධාරීන් කාර්යාලය තුළ රැඳී සිටියයුතු දිනක කාර්යාලයේ රැඳී නොසිටි අතර, දුරකතන අංක මගින් ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ ද එයද අසාර්ථක වූ බැවින් ග්‍රාම නිලධාරීන් කාර්යාල දින වසමේ කාර්යාලයේ රැඳී නොසිටින බවත් ඒ තුළින් මහජන සේවා සඵලදායීව ලබාදීමට නොහැකි වී තිබූ විගණනයේදී බැහැර කළ නොහැකි විය.
(ඉ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ----------		
(i)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය	අදාල නොවේ.	අකුරැස්ස,කඹුරුපිටිය,කොටපොල,මාතර,මුලටියන, පස්ගොඩ,නිහගොඩ හා වැලිගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක නිලධාරීන් 646 දෙනෙකු අවුරුදු 05 ක කාලසීමාව ඉක්මවා එනම් අවුරුදු 01 ත් 25 ත් අතර කාලයක් ස්ථාන මාරුවීමෙන් තොරව එකම සේවා ස්ථානයේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.
(ii)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02(II) ඡේදය	අදාල නොවේ.	ක්ෂේත්‍ර නිලධාරීන් තම ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන දිනයන්හි දී එම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කළයුතු අතර චක්‍රලේඛයේ (06) ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් එක් එක් ආයතන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයක අත්සන් තැබීම මගින් සනාථ කරගන්නේ නම් එය ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ ක්‍රමයට අමතරව කළයුතු බව සඳහන් කර තිබුණද නියැදි පරීක්ෂාවේදී ක්ෂේත්‍ර නිලධාරීන් 09 ක් විසින් පැමිණීම හා පිටවීම නිසි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකර එම දිනයන්හිදී පැමිණීම හෝ පිටවීම එක්

			සටහනක් පමණක් ඇතිලි සලකුණු යන්ත්‍රයේ හෝ පැමිණීමේ ලේඛනයේ තබා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.
(iii)	2009 අප්‍රේල් 16 දිනැති හා 09/2009 දරන වක්‍රලේඛයේ 02(IV) වගන්තිය	190,456	නිවාඩු දින වැටුප් දීමනා සඳහා, කාලය පදනම් කරගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීම සිදුකළ යුතුය. කෙසේ වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යාලගත නිලධාරීන් තිදෙනෙකු විසින් එම වක්‍රලේඛයන්ට අනුකූල නොවී එනම් ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමෙන් තොරව 2023 හා 2024 වර්ෂයේ නිවාඩු දින 50 ක් වැඩ කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි.
(iv)	2013 ඔක්තෝබර් 17 දිනැති අංක 21/2013 දරන වක්‍රලේඛයේ 02(ආ) හා (ඇ)	503,745	ලින් මාසයකට උපරිම දින ගණනක් හා උපරිම දින ගණන ඉක්මවා සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දින සේවයේ යෙදීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට අනුකූල නොවී පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එනම් නිවාඩු දින වැඩ කළ දිනෙන් පසු දින 22 ත් දින 104 ත් අතර කාල ප්‍රමාදයකින් පසු අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් විසින් නිවාඩු දින රාජකාරි දින 140 ක් වෙනුවෙන් නිවාඩු දින වැටුප් අවිධිමත් ලෙස ලබාගෙන තිබුණි.
(v)	2018 ජනවාරි 24 දිනැති 05/2018(1) වක්‍රලේඛය	අදාල නොවේ.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීම හා ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රමවේදයන් සකස් කර නොතිබුණි.

(vi)	2023 දෙසැම්බර් 29 දිනැති අංක 27/2023 දරන වක්‍රලේඛයේ 2.3.1 ඡේදය (අ)	අදාල නොවේ.	ක්ෂේත්‍රගත නිලධාරීන් කාර්යාලයේ රැඳී සිටීමට නියම කර ඇති දිනවලදී නියමිත වේලාව තුළ කාර්යාලයේ රැඳිසිටීම අත්‍යවශ්‍ය බවත් ක්ෂේත්‍රයේදී රාජකාරී ඉටුකිරීම පිළිබඳව සටහන් නැබීමට නියමිත වූ ලේඛනවල සටහන් කළයුතු බවත් සුදුසු පරිදි ක්ෂේත්‍ර සටහන් පවත්වා ගනිමින් අවශ්‍ය විටක එම ලේඛන අධීක්ෂණ නිලධාරීන් වෙත ඉදිරිපත් කළයුතු බවත්, වක්‍රලේඛයේ (ඇ)(ඉ)(ඊ) ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, සඳුදා දිනයන්හි මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇතැම් නිලධාරීන් රාජකාරී නිවාඩු, කාර්යාලයට පැමිණ බැහැරයාම හා පෞද්ගලික නිවාඩු ලබාගත් අවස්ථා නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.
(vii)	අංක එච්ඒ/ඩීඒ27/12 දරන හා 2006.03.21,2009.06.12 දිනැති ලිපි හා අංක HAF-01/14/පො.සේ.නි/26 දරන හා 2012 ඔක්තෝබර් 05 දිනැති වක්‍රලේඛය	4,051,000	ප්‍රාදේශීය ලේකම්වරු සිය කොට්ඨාශයේ නිල නිවාසය තුළ පදිංචිවීම අනිවාර්ය කර තිබුණද වැලිගම ප්‍රාදේශීය ලේකම්, නිල නිවාසයේ පදිංචිව සිට නොතිබුණි. ඒ අනුව 2007 වර්ෂයේ රු.3,922,000 ක් වැයකර ඉදිකර තිබුණු ප්‍රාදේශීය ලේකම්ගේ උපලේඛනගත නිවාසය හා එහි පැවති රු.129,000 ක් වටිනා ස්ථාවර වත්කම් 2021 ජුනි 30 දින සිට විගණිත දින දක්වා වසර 03 යි මාස 06 ක කාලයක සිට නිශ්කාර්යව පැවතීමට ඉඩහැර තිබුණි.
		අදාල නොවේ.	පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ප්‍රාදේශීය ලේකම්ට වෙන්කල උපලේඛනගත නිවාසය හා උපලේඛණගත නොවන රජයේ නිවාස 4 න් 2 ක් නිශ්කාර්යව පැවතුණි.

(ඊ)	රාජ්‍ය මුදල් වක්‍රලේඛ ----------		
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන වක්‍රලේඛයේ 03 ඡේදය	අදාල නොවේ.	ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂයේ එනම් 2024 ජනවාරි 22 දින වනවිට දින 37 ක් ප්‍රමාද වී පිළියෙල කර රාජ්‍ය පරිපාලන, ස්වාදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමුකර නිබු නමුත් ඒ සඳහා අනුමැතිය ලැබී නොනිබුණි.
(ii)	04 ඡේදය	අදාල නොවේ.	සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොනිබුණි.
(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ----------		
(i)	1.2.1(ඇ) වගන්තිය	අදාල නොවේ.	යොමුගත වගන්තිය ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතු වුවත්, ඊට අනුකූල නොවී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වැලිගම,පිටබැද්දර,මුලටියන,නිහගොඩ,කඹුරුපිටිය, වැලිපිටිය,මාතර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි

			ආපනශාලා පවත්වාගෙන යාමට පෙර සැපයුම්කරුවන් වෙතම සමාලෝචිත වර්ෂයේදීද බදු දී නිබුණි.
		7,904,061	ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.7,904,061 ක් වූ වාහන අභ්‍යන්තර අළුත්වැඩියාවන් 45 ක් එක් ගරාජයක් වෙත පමණක් යොමුකර අලුත්වැඩියා කිරීමට බලපෑ සාධාරණ හේතු නිරීක්ෂණය නොවුණි.
		4,103,759	ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් සිදුකර නිබුණු එකතුව රු.7,331,891 ක්වූ වාහන අළුත්වැඩියා 164 කින් එකතුව රු.4,103,759 ක් වටිනා වාහන අළුත්වැඩියා 55ක් එක් සැපයුම්කරුවකුගෙන් පමණක් සිදුකර නිබුණු අතර, ඊට බලපෑ සාධාරණ හේතු විගණනයේදී නිරීක්ෂණය නොවීය.
(ii)	7.8.4(ඒ) වගන්තිය	895,371	යටියන තැන්නහේන පාර ගල්පොත්ත අසල සිට අම්බලන්ගොඩ ගෙදර දෙසට මාර්ගයේ නායගොස් ඇති කොටස පැනිබැම්ම යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් නිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිහගොඩ ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත වී නිබුණු අතර ප්‍රාදේශීය සභාව විසින් දිරිය ප්‍රජා සංවර්ධන සමිතිය වෙත ව්‍යාපෘතිය ඉටුකිරීමට උප කොන්ත්‍රාත් ලබාදී නිබුණි. ඒ පිළිබඳ සළකා බැලීමෙන් තොරව ප්‍රාදේශීය සභාව වෙත රු. 895,371 ක මුදලක් ගෙවීම කර නිබුණි.
		2,522,000	වැඩවල ප්‍රධාන සංරචකයන් උප කොන්ත්‍රාත්දීම විශාල බැහැරවීමක් සේ සලකා කටයුතු කළ යුතු වුවත් කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සභාවට පවරා දී නිබුණු එකතුව

			රු.2,522,000ක්වූ බටුකිත්තල සිට ගොවිපල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම හා නිශ්ශංකපුර, ප්‍රධාන මාර්ගයේ අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති ප්‍රාදේශීය සභාව විසින් උප කොන්ත්‍රාත් ලබා දී තිබුණද, ඒ පිළිබඳ සලකා බැලීමෙන් තොරව ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම් කර තිබුණි.
(iii)	9.8 ඡේදය	අදාල නොවේ.	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 විසින් රජයේ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e-GP) ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඌ)	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2021/05 දරන හා 2021 ජූලි 20 දිනැති වක්‍රලේඛයේ 02 වගන්තිය හා 2008/4(1) දරන වක්‍රලේඛය	අදාල නොවේ.	සුනාමි නිවාස 15 ක් ප්‍රතිලාභීන් නොවන පාර්ශව විසින් බුක්ති විඳිනු ලැබුවත් ඊට එරෙහිව නීති රීති හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට වගකිව යුතු නිලධාරීන් සමත් වී නොතිබුණි.
(එ)	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 03/2022 දරන හා 2022 ජුනි 10 දිනැති වක්‍රලේඛය 03 (ඇ) ඡේදය හා 07 ඡේදය	9,415,350	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විසින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 03/2022 දරන හා 2022 ජුනි 10 දිනැති වක්‍රලේඛයේ 03(ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාම වැටුප් එකතුව රු.18,893,616 කින් රු.9,415,350 ක් 2024 දෙසැම්බර් 31 දිනට් තවදුරටත් අයවීමට තිබුණි.

(ඒ)	අංක 01/1020 දරන ආපදා කළමනාකරණ මාර්ගෝපදේශයේ 04(iii) වගුව 1.4	අදාල නොවේ.	ආපදාව සිදු වී සති 02 ක් තුළ ගෙවීම් කටයුතු ආරම්භ කර මාසයක් ඇතුළත දී ගෙවීම් අවසන් කළ යුතු නමුත් පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසම් හාර ග්‍රාම නිලධාරී, තාක්ෂණික නිලධාරී හා ආපදා සහන සේවා නිලධාරී විසින් සිදු වී තිබුණු ආපදාවන් වෙනුවෙන් ප්‍රතිලාභීන් 22 කුට අදාළ වන්දි මුදල් තක්සේරු කර මසක් ඇතුළත ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ඔ)	අංක NDRSC/1/2/1 දරන හා 2020 මැයි 15 දිනැති ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ අංක 01/2020 හි 4.(V)	80,000	වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ආපදා හානි වූ ප්‍රතිලාභීන් 08 දෙනෙකුට රු.10,000 බැගින් එකතුව රු. 80,000 ක්වූ මූලික ගෙවීම ගෙවා නිබුණද, චක්‍රලේඛ ප්‍රකාරව ආපදා හානි ගෙවීමට ප්‍රථම හඳුනාගත යුතු තොරතුරු හා සාක්ෂි නොමැතිවීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට ඉතිරි වන්දි වශයෙන් ගෙවිය යුතු එකතුව රු.222,193 ක් ගෙවා නොතිබුණි. ඒ අනුව අදාළ ප්‍රතිලාභීන්ට ගෙවා නිබුණු රු.80,000 ක් නිශ්කාර්ය වියදම් වීමට වගකිව යුතු නිලධාරීන් විසින් ඉඩහැර නිබුණි.
(ඕ)	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF/01/9 විවිධ හා 2013 ජුනි 05 දිනැති ලිපියේ 2 ඡේදයේ 5 වන වගන්තිය	අදාල නොවේ.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා මුලටියන, තිහගොඩ, වැලිගම, කඹුරුපිටිය, කොටපොල, මාතර,පිටබැද්දර යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07ක ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධව සිදුකල නියදි පරීක්ෂාවේදී ක්ෂේත්‍ර නිලධාරීන් 245 ක් මෙම වගන්තියට අනුකූල නොවී දින 02ත් දින 332ත් අතර කාල ප්‍රමාදයකින් ඉදිරි වැඩසටහන් හා ක්ෂේත්‍ර නිලධාරීන්183ක් දින 03ත් දින330 ත් අතර කාල ප්‍රමාදයකින් ඉටුකළ වැඩසටහන් ඉදිරිපත් කර තිබුණි.

අදාල නොවේ	සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් තම ක්ෂේත්‍ර රාජකාරි පිළිබඳ විස්තර ක්ෂේත්‍ර රාජකාරි පොතේ එදිනෙදා සටහන් කළයුතු අතර එය වරින්වර දිස්ත්‍රික් ලේකම්ගේ /ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණයට ඉදිරිපත් කර පරීක්ෂා කළ බවට අත්සන් ලබාගත යුතු වුවත් නිලධාරීන් විසින් විධිමත්ව ක්ෂේත්‍ර පොත් පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය වුණි.

3.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව අවස්ථා 18 දී නිලධාරීන්ට නිකුත් කර තිබුණු එකතුව රු. 440,972 ක්වූ අතුරු අග්‍රිම පියවීමට දින 13 ත් දින 269 ත් අතර කාලයක් ප්‍රමාද වී නිබුණි.

3.7 නැන්පතු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නැන්පත් කළ දින සිට වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු.5,870,922 ක් වටිනා නැන්පතු ශේෂ 37 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු ඒ අතුරින් එකතුව රු.3,460,374 ක් වටිනා නැන්පතු ශේෂ 14 ක් නැන්පත් කළ දින සිට වසර 05 ක් ඉක්මවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ජහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කඳුකර දශකය 2024-2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 08 ක ප්‍රතිලාභීන් 51 කට කුරුඳු පැළ 42,440 ක් ලබා දී තිබුණු අතර ඉන් ප්‍රතිලාභීන් 23 දෙනෙකුට ලබාදුන් කුරුඳු පැළ 11,435 ක්ෂේත්‍රයේ සිටුවා නොතිබුණු බැවින් ඒ වෙනුවෙන් වැයකර තිබුණු රු. 285,875 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

(ආ) කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බටුකිත්තල සිට ගොවිපල දක්වා මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ගයේ අතුරා තිබුණු කැටගල්වලින් ලබාගත් නියැදි කැටගල් 03 ක් සම්බන්ධයෙන් ලබාගත් මාර්ග සංවර්ධන අධිකාරියේ පරීක්ෂණාගාර තත්ත්ව වාර්තාව අනුව කැටගල් 03 න් 02 ක නියමිත සම්පීඩන ශක්තිය නොමැති බවට නිරීක්ෂණය විය. ඒ අනුව මාර්ගයේ අතුරා තිබුණු කැටගල් නියමිත ප්‍රමිතියෙන් තොර බවට රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය වූයෙන් අංක 05 දරන වැඩ විෂයය යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.797,098 ක් අවිධිමත් හා නිශ්කාර්ය වියදම් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිශ්ශංකපුර ප්‍රධාන මාර්ගයේ අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිමකර තිබුණු මාර්ගයේ සම්පූර්ණ දුර දිග මීටර් 137න් මීටර් 78 ක ප්‍රමාණයක පමණ ABC ගල් මතු වී එම ගල් ගැලවී යන තත්ත්වයට පත්වීමෙන් මාර්ගයේ අනාගත පැවැත්මට අහිතකර ලෙස බලපා තිබුණු බවත් කොන්ක්‍රීට් මිශ්‍රණයන් නියමිත ප්‍රමිතියෙන් තොරවීම ඊට හේතු වී ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව සංවර්ධනය කර තිබුණු පාරෙහි සම්පූර්ණ දුර ප්‍රමාණයෙන් සියයට 56.5 ක් නියමිත ප්‍රමිතියෙන් තොර බවට නිරීක්ෂණය වූයෙන් ඒ සම්බන්ධයෙන් ස්වාධීන තාක්ෂණික ක්ෂේත්‍ර පරීක්ෂාවන් හා රසායනාගාර තත්ත්ව පරීක්ෂා සිදුකර, ඒ පිළිබඳ වාර්තා හා සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු බවත් අංක 03 දරන වැඩ විෂයය යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 699,482 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණු බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කඳුකර දශකය වැඩසටහන යටතේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගේබියන් පැති බැම්මක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඹුල්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සමිතිය සමග රු.1,456,126 කට ගිවිසුම්ගත වී තිබුණි. පැනිබැම්මට නියමිත ප්‍රමාණයෙන් යුතු ගල් යොදා නොමැතිවීම මත ගේබියන් පෙට්ටි ඇතුළත හිස් අවකාශ නිර්මාණය වී ගේබියන් පෙට්ටි ඉදිරියට නෙරා ඇති බවත් ඒ හේතුවෙන් බැම්මේ ශක්තිමත්භාවය අඩු වී ඇති බවත් බැම්මට පහළින් පිහිටි නිවසට අනතුරුදායක තත්වයට පත්ව ඇති බවත් නිරීක්ෂණය වූයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.1,310,513 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ඒ) ප්‍රකාරව වැඩවල ප්‍රධාන සංරචකයන් උප කොන්ත්‍රාත් දීම විශාල බැහැරවීමක් සේ සලකා කටයුතු කළ යුතු වුවත් ඊට අනුකූලව

කටයුතු කර නොනිබුණු අතර, ඉඹුල්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සමිතිය විසින් මුළු ව්‍යාපෘතියම උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා ඔවුන් මගින් වැඩ ඉටුකර නිබුණු බවට විගණනයේදී සාක්ෂි ඉදිරිපත් වූයෙන් ඒ පිළිබඳ සලකා බැලීමෙන් තොරව අවිධිමත් ලෙස ගෙවීම් කර නිබුණි.

(ඉ) කඳුකර දශකය වැඩසටහන යටතේ අකුරැස්ස-යාකබැද්ද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය පිළිසකර කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 09 යටතේ ඉටුකළ යුතුව තිබුණු වඩිම්බු ලැලි දෙවරක් තීන්ත ආලේප කිරීම සිදුකර නොනිබුණු බැවින් නියමිත ප්‍රමිතියෙන් තොරව අදාළ වැඩ විෂයය සිදුකර නිබුණු බැවින් එම වැඩ විෂයය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.134,314 ක් නිශ්කාර්ය වියදම් වී නිබුණි. මෙම කාර්යාලය වටා රු.205,932 ක් වැය කර වැටක් ඉදිකර නිබුණත්, විගණිත දින වනවිට එම කම්බි වැට හානියට පත්ව නිබුණු බැවින් ඒ වෙනුවෙන් දැරූ වියදම් නිශ්කාර්යය වියදම් වී නිබුණි.

4.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබුණු එකතුව රු.2,775,000 ක්වූ ප්‍රතිපාදන මත වැඩ ආරම්භ කර නිබුණු ව්‍යාපෘති 12 ක් අතරමහ නතර කර අතහැර දමා නිබුණු අතර ඒ වෙනුවෙන් විගණිත දින වන විට වැයකර නිබුණු එකතුව රු.1,663,014 ක් නිශ්කාර්යය වියදම් වී නිබුණි.

4.1.3 ප්‍රතිපාදන ලැබී නිබුණද ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් සඳහා කඳුකර දශකය වැඩසටහන හා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 73 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එකතුව රු.33,751,479 ක්වූ ප්‍රතිපාදන ලැබී නිබුණු අතර, 2024 දෙසැම්බර් 31 වනවිටත් අදාළ ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මකකර නොනිබුණු බැවින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ළඟාකර ගත හැකි මහජන සුබසාධනයන් අහිමි කර නිබුණි.

4.1.4 වෙනත් නිරීක්ෂණ

වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උස්ගෙඩිවත්ත මාර්ගය හා අතුරු පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හා ජනාවාස ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය වෙනුවෙන් තාක්ෂණික නිලධාරී විසින් සකස් කර නිබුණු ව්‍යාපෘති ඇස්තමේන්තු පිළියෙල/සකස් කළ දිනය, පරීක්ෂා කළ දිනය, නිර්දේශ කළ දිනය හා අනුමත කළ දිනය ඇතුළත් නොවූයෙන්

අදාළ ඇස්තමේන්තු සකස් කිරීමට පදනම් කරගත් මිල විස්තරයන් (Rate Schedule) හෝ ඇස්තමේන්තු මිල ගණන් අදාළ වන අර්ධ වර්ෂයන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ටයර් සැපයීම වෙනුවෙන් ටයරයක් සඳහා ඉදිරිපත් කල පිරිවිතරයන්ට අනුකූලව රු.50,000 ක අවම මිලගණන් ඉදිරිපත් කර නිබුණු සැපයුම්කරු ප්‍රතික්ෂේප කර රියදුරුගේ ඉල්ලීම මත හා සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසුව ඇති කරගත් විවිධ උපකල්පන මත පදනම්ව ටයරයක් සඳහා රු.70,700 ක්වූ දෙවන අවම මිළ ඉදිරිපත් කර නිබුණු සැපයුම්කරුගෙන් ටයර් 04 ක් මිලදී ගැනීම හේතුවෙන් රු.82,800 ක මූල්‍ය පාඩුවක් රජයට සිදුකර නිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) යටියන තැන්නහේන පාරේ ගල්පොත්ත අසල සිට අම්බලන්ගොඩ ගෙදර දෙසට මාර්ගයේ නායගොස් ඇති කොටස පැනිබැම්ම යොදා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකළ විගණන භෞතික පරීක්ෂාවේ දී පැනි බැම්මේ හනිකොම්බ පැවතීම, ප්‍රමාණය අගල් 6*4 ට වඩා අඩු ප්‍රමාණයේ ගල් යොදා කොන්ක්‍රීට් මිශ්‍රණය යොදා නිබීම, ෆෝම් වර්ක් නියමිත ප්‍රමිතියෙන් තොරවීම හා පැනි බැම්ම දෙපස සෝදා යාමකට ලක්ව පැවතීම ආදී හේතු නිසාවෙන් පැනි බැම්මේ ශක්තිමත්භාවයට අහිතකර ලෙස බලපා ඇති බව විගණනයට නිරීක්ෂණය වූයෙන් අදාළ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී එකඟවිය නොහැකි වූයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා නිබුණු රු.895,371ක් නිෂ්කාර්ය වියදම් වී නිබුණු බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඇ) නිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බෆල් සෙට් 01 ක් මිලදී ගැනීමේදී පිරිවිතරයන්ට අනුව අවම මිල ඉදිරිපත් කර නිබුණු සැපයුම්කරුගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර ප්‍රතිලාභියාගේ ඉල්ලීම මත පදනම්ව ප්‍රසම්පාදන කමිටුව විසින් වැඩි මිලට බෆල් සෙට් 01 ක් රු.71,687 ක්වූ වට්නාකමකට මිලදී ගැනීමේදී රු.31,887 ක අලාභයක් රජයට සිදුකර නිබුණි.

(ඇ) නිහගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කර තිබුණු මිල පිරිවිතරයන්ට අනුව සැපයුම්කරුවන්ගේ මිල ගණන් ඇගයීමෙන් තොරව රු.224,500 ක්වූ වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් Canon ir 2224 N යන්ත්‍රය මිලදී ගැනීමේදී රු.126,000 ක් වැඩිපුර ගෙවීම හේතුවෙන් එලෙස වැඩිපුර ගෙවූ මුදල රජයට පාඩුවක් වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 1.2.1 හි දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් සහතික විය යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා එනම් භාණ්ඩ මිලදී ගැනීම සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.6 වගන්තියට අනුකූලව කටයුතු නොකර කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් සඳහා ස්මාර්ට් ටී.වී. 18 ක් මිලදී ගැනීමේ දී රු.395,393 ක් ද පාසල් සඳහා ස්මාර්ට් ටී.වී. 03 ක් මිලදී ගැනීමේ දී රු.68,696 ක්ද වැඩිපුර ගෙවීමෙන් රජයට එකතුව රු.464,089 ක මූල්‍ය පාඩුවක් සිදුකර තිබුණි.

(ඊ) දශවිධ කඳුකර දශකය 2024 – 2033" විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන්ට හා කාර්යාලයට උස අඩි 06, පළල අඩි 1.5 හා දිග අඩි 03 ක්වූ වානේ කබඩ 02 ක් මිලදී ගැනීමේදී පිරිවිතරයන්ට අනුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් 04 දෙනෙකුගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිලට භාණ්ඩ මිලදී ගැනීමේදී රු.39,020 ක පාඩුවක් සිදුකර තිබුණි.

(උ) කඳුකර දශකය වැඩසටහන යටතේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන්ට ලබාදීමට රු.39,428 ක් (වැට් රහිත) වටිනා 6 x4 වීදුරු වානේ කබඩ 01 ක් දෙනියායේ දම්රෝ ආයතනයෙන් මිලදී ගැනීමේදී සාරානුකූල ප්‍රතිවාර දක්වා තිබුණු හා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු පළමු හා දෙවන සැපයුම්කරුවන්ගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර ලංසු ලේඛනවල ඇතුළත් නොවූ පිරිවිතරයන් අඩුකින් එකතු කර තුන්වන අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී රු.9,328 ක් වැඩිපුර ගෙවීමට සිදුවීමෙන් රජයට පාඩු සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(උ) කඳුකර දශකය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබාදීමට 6 x 3 x 1.5 එක් වානේ අල්මාරියක් රු.46,710 (වැට් රහිත) බැගින් රු.140,130 කට අල්මාරි 03 ක් මිලදී ගැනීමේදී ඉල්ලුම් කළ පිරිවිතරයන්ට අනුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන්ගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර 08 වෙනි ස්ථානයට අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී රු.58,530 ක පාඩුවක් සිදුකර තිබුණි.

(ඒ) කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේදී කාර්යාලයට අවශ්‍ය ටෝනර් මිලදී ගැනීමේදී ඉල්ලුම් කළ පිරිවිතරයන්ට අනුකූලව සැපයුම්කරුවෙකු විසින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණද, පිරිවිතරයන්ට අනුකූල නොවූ හා ලිඛිත හා ප්‍රමාණාත්මක සාක්ෂි නොමැති කරුණු දක්වමින් වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී එකතුව රු.122,001 ක අලාභයක් රජයට සිදුකර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ඇතැම් යන්ත්‍ර හා උපකරණ සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමග සේවා ගිවිසුම්වලට එළඹී තිබුණද, සැපයුම්කරුවන් විසින් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂිකව සිදුකිරීමට නියමිත වූ සේවා වාරයන් ප්‍රමාණය සිදුකර නොතිබුණු බැවින් වාර්ෂික සේවා ගිවිසුම් වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු රු. 1,560,253 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණි. තවද මේ පිළිබඳව අධීක්ෂණයද මේ නිසා සතුටුදායක නොවන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) අළුත්වැඩියා නොකළ වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින ත්‍රිරෝද රථය 2022 සැප්තැම්බර් 27 දින සිට අළුත්වැඩියාවෙන් තොරව හා භාවිතයෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ගර්හිතව පැවතුණු බැවින් රජයේ දේපළ විවක්ෂණශීලීව උපයෝජනයට යොදාගෙන නොතිබුණු බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ii) කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක SP – JY 6556 දරන ත්‍රිරෝද රථය 2019 දෙසැම්බර් මස 28 දින අවසන් වරට ධාවන කර තිබුණු අතර ත්‍රිරෝද රථය එදින සිට අළුත්වැඩියාවකින් තොරව දීර්ඝ කාලයක් නිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(iii) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණයේදී අළුත්වැඩියා කළයුතු ලෙස හඳුනාගත් රු.183,650 ක් වටිනා Cannon ඡායා පිටපත් යන්ත්‍රය හා රු.109,000 ක් වටිනා Kyocera ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, එක් යන්ත්‍රයක වාර්ෂික සේවා ගිවිසුම් අළුත් කිරීම වෙනුවෙන් රු.28,910 ක් ගෙවා තිබුණු බැවින් අදාළ වියදම් නිෂ්කාර්ය හා අවිධිමත් වියදම් වී තිබුණි.

(ඇ) ඌණ උපයෝජිත වත්කම්

වර්ග අඩි 2398.5 ක් වූ කොටපොල ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2024 අප්‍රේල් 09 දින රු.541,495 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු අතර, 2021 ඔක්තෝබර් 11 දින සිට ප්‍රාදේශීය ලේකම්තුමිය පදිංචි නොවීමෙන් අදාල දේපල ඌණ උපයෝජිතව පැවතුණු බැවින් රජයේ දේපළ විචක්ෂණශීලිව පරිහරණය කිරීමට අවශය පියවර ගෙන නොතිබුණි.

4.4 පාඩු හා හානි

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාළව 2024 වර්ෂයට අදාළව සිදුවී ඇති හානි පාඩු පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක 2024 වර්ෂයේදී සිදු වී තිබුණු රු.165,346 ක් වූ හානි හා පාඩු 02ක් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම් 01 යටතේ තවදුරටත් ක්‍රියාකිරීමට ඇති හානි හා පාඩු යටතේ දක්වා නොතිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක සිදු වී තිබුණු රථවාහන අනතුරු 03ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් තක්සේරු කර අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හුට වැල් සහිත වතුර මෝටරයක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි 104(3) පරීක්ෂණ පවත්වා 2023 දෙසැම්බර් 04 දින විමර්ශනයක් පවත්වා නිබුණු නමුත් මූදල් රෙගුලාසි 104(4) ට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.

4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 50 කට 2025 මැයි 27 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොනිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.64,197,761ක් විය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉදිකර නිබුණු සුනාමි සංකීර්ණ නිවාස 10 හි වසර 20 ක සිට පදිංචිව සිටින නිවාසලාභීන් 56 ක් වෙත දීමනාපත්‍ර සකස් කර නිවාස පැවරීමට මේ දක්වා කටයුතු කර නොනිබුණි.

(ආ) වැලිගම කොට්ඨාශයේ පොල්වතුමෝදර ග්‍රාම නිලධාරී වසමේ කන්දපාමුලවත්ත සුනාමි නිවාස සංකීර්ණයේ සුනාමියෙන් අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉදිකර නිබුණු සභාධිපත්‍ය දේපලෙහි සුනාමියෙන් අවතැන් වූ පුද්ගලයින් 05 ක් වෙත මුල් පදිංචිය ලබාදී නිබුණු බවත්, තවත් මුල් පදිංචිකරුවන් 07 දෙනෙකු විසින් නිවාස විකුණා වෙනත් පුද්ගලයින් පදිංචි කර නිබුණු බවත්, තවත් නිවාස 03 ක් වසා දමා නිබුණු බවත් නිරීක්ෂණය වූයෙන් අදාළ නිවාස සංකීර්ණය අරමුණින් පරිබාහිර කාර්යයන්ට යොදාගෙන නිබුණු බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඇ) මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 04 කට අයත් පර්චස් 75 ක් වූ රජයේ ඉඩම් කැබලි 04 ක දුරකථන සමාගම් 04 ක් විසින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 ක් ඉදිකර ඉඩම් බුක්ති විඳිමින් සිටින අතර, අදාළ ඉඩම් දීර්ඝකාලීන බදු පදනමට ලබාදීම සඳහා කටයුතු ආරම්භ කර වසර 14 ත් 20 ත් අතර කාලයක් දක්වා ප්‍රමාද වී නිබුණි. එසේම වසර 01 ත් 04 ත් අතර කාලයක සිට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී නොනිබුණු දීර්ඝ කාලීන බදු ලිපිගොනු 10 ක් පැවතුණු බැවින් රජයට උපයා ගැනීමට හැකිව නිබුණු බදුකුලී ආදායම් අහිමි කර නිබුණි.

(ඇ) නායයෑම් පිළිබඳ අධි අවදානම මත 2019 වර්ෂයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් දැනුම් දී ඇති පරිදි පදිංචි ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කිරීම සඳහා ප්‍රතිලාභීන් 03කට ලබාදීමට රජයේ ඉඩම් නිසිපරිදි මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා නොගැනීම හේතුවෙන් ප්‍රතිලාභීන් අවධානම් සහිත නිවසේම තවදුරටත් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක පවිත්‍රතා සේවා පවත්වාගෙන යාමේදී පවිත්‍රතා උපකරණ හා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.26,660,379 ක් ගෙවා තිබුණ ද අදාළ උපකරණ හෝ රසායනික ද්‍රව්‍ය කාර්යාල ගබඩාවට ලැබී නොතිබුණු අතර ඒවා පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක ඇතුළත් කිරීමෙන් තොරව පවිත්‍රතා සේවකයින් විසින් භාවිතා කරන බව නිරීක්ෂණය වූයෙන් පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ලැබීම් නිකුත් කිරීම් සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බවද නිරීක්ෂණය කෙරේ.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක හා කෘතික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු 15 ක් පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතියික මට්ටමේ තනතුරු 326 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 ක නිලධාරීන් 334 ක අතිරික්තයක් පැවති අතර එම අතිරික්ත නිලධාරීන් සුදුසු පරිදි තුලනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2018 හා 2018 දරන හා ජනවාරි 24 දිනැති වක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 06 කට, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 31 කට හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත සමෘද්ධි මූලස්ථානයට අනුයුක්ත නිලධාරීන් 04 කට විධිමත් පදිංචි රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණු බැවින් ඔවුන්ගේ රාජකාරි පිළිබඳ අධීක්ෂණය හා පසුවිපරම් පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ඉ) 2019 ජූලි 04 දින, එවකට කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ (වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය) වැවිලි ප්‍රජා සන්නිවේදන සලසන්නා තනතුරට පුද්ගලයෙකු පත්කර මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එදින සිට අනුයුක්ත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ විගණිත අවස්ථාව වනවිට එම නිලධාරියා පත්ව අවුරුදු 05 ක කාලයක් ගතව තිබුණත් ඉටුකළයුතු රාජකාරි පිළිබඳ රාජකාරි ලැයිස්තුවක් හිමිව නොතිබුණි. මෙම නිලධාරියා ඉටුකළ රාජකාරි පිළිබඳ නිසි අධීක්ෂණයක් නොමැතිව වැටුප් හා දීමනා වශයෙන් රජය දැරූ රු.2,589,884 ක මුදල අපේක්ෂිත අයුරින් සඵලදායී වී නොමැති බවත් නිරීක්ෂණය වේ.

(ඊ) ප්‍රජාමූල බැංකුව සේවා ස්ථානය ලෙස නම්කර ස්ථාන මාරු කර තිබුණු නිලධාරීන් 07 දෙනෙකුගේ ස්ථාන මාරු ක්‍රියාත්මක වී නොතිබුණු අතර, අදාළ නිලධාරීන් මූලස්ථානයේ රැඳීසිටින බවත් ඉන් නිලධාරීන් 02 ක් සඳහා විගණිත දින දක්වා රාජකාරි ලැයිස්තු ලබාදී නොතිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අදාළ නිලධාරීන් විධිමත් පරිදි සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමට හෝ රාජකාරි පැවරීමට වගකිව යුතු නිලධාරීන් සමත් වී නොතිබුණි.

(උ) මධ්‍යම රජයට අයත් කාර්මික නිලධාරීන් සහ තාක්ෂණික සහකාර නිලධාරීන් නිසි පරිදි එක් එක් කාර්යාලවලට අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කර්යාල 07 ක පුරප්පාඩු 11 ක් හා කාර්යාල 02 ක අතිරික්ත නිලධාරීන් 03 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පුරප්පාඩු හා අතිරික්තතා තුලනය කර එනම් අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින කාර්යාලවලට අනුයුක්ත කර නොතිබුණු බැවින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී කාර්මික නිලධාරීන්ගේ දායකත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සමානව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) පළාත් සභා කාර්මික නිලධාරීන් නිසි පරිදි එක් එක් කාර්යාලවලට අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කර්යාල 06 ක පුරප්පාඩු 06 ක්, හා කාර්යාල 02 ක අතිරික්ත නිලධාරීන් 02 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පුරප්පාඩු හා අතිරික්කතා තුලනය කර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී කාර්මික නිලධාරීන්ගේ දායකත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවට සමානව ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

එන්.එම්.එස්. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් 1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ස හා අ.ක.ස

2. අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කා.දැ.ස හා අ.ක.ස.